අ.පො.ස (සා.පෙළ) විභාගය - 2012

ඇගයීම් වාර්තාව

21 - සිංහල භාෂාව හා සාහිත්‍යය



පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.

අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2012

ඇගයීම් වාර්තාව

21 - සිංහල භාෂාව හා සාහිත්‍යය



පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

සියලු ම හිමිකම් ඇවිරිණි.

සිංහල භාෂාව හා සාහිත්‍යය
ඇගයීම් වාර්තාව - අ.පොෙ.ස.(සා.පෙළ) විභාගය - 2012

මූල්‍ය අනුග්‍රහය

අනාගත දැනුම් කේන්ද්‍රීය පදනම ලෙස පාසල්
පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය
(TSEP-WB) මගින්.

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ විභාග අතුරින් වැඩි ම අයදුම්කරුවන් සංඛ්‍යාවක් පෙනී සිටින්නේ අ.පොෙ.ස.(සා.පෙළ) විභාගය සඳහා ය. ජාතික මට්ටමින් පැවැත්වෙන මෙම විභාගයේ ප්‍රතිඵල මත නිකුත් කෙරෙන සහතිකය, උසස් අධ්‍යාපනය සඳහා සුදුස්සන් තෝරා ගැනීමට පමණක් නොව මධ්‍යම මට්ටමේ රැකියා අවස්ථා ලබාගැනීමට ද ජාතික හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල සමහර පාඨමාලා හැදෑරීමට මූලික සුදුසුකමක් ලෙස සැලකෙන මිනුම් දණ්ඩක් වශයෙන් ද පිළිගැනේ. මෙලෙස පිළිගැනෙන්නේ මෙම විභාගයේ ඇති වලංගුතාව හා විශ්වසනීයතාව මෙන් ම ඉහළ ගුණාත්මක බව ද හේතුවෙනි.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද දැඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකරගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහාය දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයින්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයින්ට එක සේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. මේ නිසා මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා පුස්තකාලයට යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව කොටස් තුනකින් යුක්ත වන අතර විෂය අභිමතාර්ථ සහ විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද මෙම විෂයයෙහි ප්‍රශ්න පත්‍ර ඇසුරෙන් අයදුම්කරුවන්ගේ සාධනය, එක් එක් ප්‍රශ්නය සඳහා වෙන් වෙන්ව ද මෙහි I කොටසෙහි ඇතුළත් වේ. ඇගයීම් හා පරීක්ෂණ ක්ෂේත්‍රයේ භාවිත වන සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) සහ අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) පදනම් කරගෙන, විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මඟින් මෙම විශ්ලේෂණ සිදුකර ඇත.

සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයයෙහි I, II හා III ප්‍රශ්න පත්‍ර සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටි, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා ප්‍රතිපෝෂණය සඳහා වූ යෝජනාවලින් මෙම වාර්තාවෙහි II කොටස සමන්විත වේ.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟාවීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

මෙම වාර්තාවේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමුකරන ලෙස ඉල්ලමි. මෙම වාර්තාව සකස් කිරීම සඳහා කැප වූ පාලක පරීක්ෂකවරුන් ඇතුළු සම්පත් දායකයින්ටත් RD ආකෘති මඟින් තොරතුරු සැපයූ ප්‍රධාන/අතිරේක ප්‍රධාන/සහකාර පරීක්ෂකවරුන්ටත් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු ම දෙනාටත් මාගේ හෘදයංගම ස්තුතිය පළ කරමි.

ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර
විභාග කොමසාරිස් ජනරාල්

2013 නොවැම්බර් 11
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

උපදේශනය	:	ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්පකුමාර විභාග කොමසාරිස් ජනරාල්
මෙහෙයවීම හා සංවිධානය	:	ගයාත්‍රි අබේගුණසේකර විභාග කොමසාරිස් (පර්යේෂණ හා සංවර්ධන)
සම්බන්ධීකරණය	:	ඊ. කුලසේකර නියෝජ්‍ය විභාග කොමසාරිස්
සංස්කරණය	:	මහාචාර්ය රත්න විජේතුංග ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය ආචාර්ය ස්වර්ණා ඉහළගම සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්ව විද්‍යාලය
සැකසුම් කමිටුව	:	ගයා වැයිහේන ගුරු උපදේශක කලාප අධ්‍යාපන කාර්යාලය හෝමාගම එම්.එම්. සුනිල් බණ්ඩාර ගුරු උපදේශක කලාප අධ්‍යාපන කාර්යාලය මහව ජී.එච්.එම්. චන්ද්‍රරත්න නියෝජ්‍ය විදුහල්පති බ/ශ්‍රී රාහුල මහා විද්‍යාලය බදුල්ල එච්.ඩී.එම්. සෙනෙවිරත්න නියෝජ්‍ය විදුහල්පති මිනු/vi වන පාවුළු පාප් මහා විද්‍යාලය හල්පෙ කටාන නන්දා සෙනෙවිරත්න ගුරු සේවය I කෑ/ශාන්ත ජෝෂප් බාලිකා මහා විද්‍යාලය කෑගල්ල
පරිගණක පිටපත සැකසුම	:	කේ. ඒ. අයි. බණ්ඩාර පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු

ඇතුළත පිටු

පිටු අංකය

I කොටස

1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අභිමතාර්ථ 1

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු
- 1.2.1 විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 2
- 1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 2
- 1.2.3 ප්‍රථම වරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 3
- 1.2.4 ප්‍රථම වරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව 4
- 1.2.5 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 7

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය
- 1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 8
- 1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 9
- 1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 9
- 1.3.4 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 10
- 1.3.5 III ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 11
- 1.3.6 III ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය 11
- 1.3.7 III ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 12

II කොටස

2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු
- 2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 13
- 2.1.2 I ප්‍රශ්න පත්‍රය 14
- 2.1.3 I ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය 18
- 2.1.4 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ (තේමා අනුව) 19
- 2.1.5 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස) 20
- 2.1.6 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 21

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු
- 2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 24
- 2.2.2 II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන 25

2.3 III ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු
- 2.3.1 III ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 39
- 2.3.2 III ප්‍රශ්න පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය, එම ප්‍රශ්නය සඳහා අපේක්ෂිත පිළිතුර, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන 39

III කොටස

3. පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

3.1 පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු 54

3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සංවර්ධනය සඳහා අදහස් හා යෝජනා 55

I කොටස

1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අභිමතාර්ථ

* අවබෝධයෙන් යුතුව ශ්‍රවණය, කථනය, කියවීම, ලිවීම යන චතුර්විධ කුසලතා සංවර්ධනය කිරීම
* නිරවුල් ලිඛිත ප්‍රකාශන සඳහා නිවැරදි භාෂා කුසලතා වර්ධනය කිරීම
* විවිධ සාහිත්‍ය කෘති පරිශීලනය කිරීමෙන් ජීවිත පරිඥානය ලබාදීම
* ජීවන වෘත්තීන්වලට අදාළ ව භාෂාව ප්‍රායෝගිකව උපයෝගි කර ගැනීමේ කුසලතා වර්ධනය කිරීම
* සිංහල භාෂා සාහිත්‍ය පරිචය මගින් සංස්කෘතික දායාද, ආචාර ධර්ම හා ජීවන දෘෂ්ටි ආකල්ප හා ඇගයුම පිළිබඳ කුසලතා වර්ධනය කිරීම
* විවිධ සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කිරීමෙන් ලබාගත් අත්දැකීම් ආශ්‍රයෙන් සාහිත්‍ය රසඥතා වර්ධනය හා නිර්මාණකරණය සඳහා යොමු කිරීම

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

1.2.1 විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව

මාධ්‍යය	පාසල්	පෞද්ගලික	එකතුව
සිංහල	232404	8720	241124

වගුව 1

1.2.2 අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

ශ්‍රේණිය	පාසල් අයදුම්කරුවන්		පෞද්ගලික අයදුම්කරුවන්		එකතුව	ප්‍රතිශතය
	සංඛ්‍යාව	ප්‍රතිශතය	සංඛ්‍යාව	ප්‍රතිශතය		
A	49252	21.19	461	5.29	49713	20.62
B	42422	18.25	935	10.72	43357	17.98
C	61282	26.37	2882	33.05	64164	26.61
S	45065	19.39	2651	30.40	47716	19.79
W	34383	14.80	1791	20.54	36174	15.00
එකතුව	**232404**	**100.00**	**8720**	**100.00**	**241124**	**100.00**

වගුව 2

1.2.3 ප්‍රථම වරට පෙනීසිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

දිස්ත්‍රික්කය	පෙනී සිටි සංඛ්‍යාව	විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ		අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ		සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ		සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ		සමත් (A+B+C+S)		දුර්වල (W)	
		සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
1. කොළඹ	27430	8727	31.82	5242	19.11	5903	21.52	3921	14.29	23793	86.74	3637	13.26
2. ගම්පහ	24614	5945	24.15	4757	19.33	5948	24.17	4276	17.37	20926	85.02	3688	14.98
3. කළුතර	13225	3544	26.80	2564	19.39	2997	22.66	2199	16.63	11304	85.47	1921	14.53
4. මහනුවර	14910	3547	23.79	2778	18.63	3776	25.33	2550	17.10	12651	84.85	2259	15.15
5. මාතලේ	5285	999	18.90	1009	19.09	1423	26.93	973	18.41	4404	83.33	881	16.67
6. නුවරඑළිය	4488	783	17.45	851	18.96	1192	26.56	902	20.10	3728	83.07	760	16.93
7. ගාල්ල	14805	3931	26.55	2790	18.84	3485	23.54	2292	15.48	12498	84.42	2307	15.58
8. මාතර	10944	2658	24.29	2103	19.22	2553	23.33	1906	17.42	9220	84.25	1724	15.75
9. හම්බන්තොට	8607	1756	20.40	1644	19.10	2200	25.56	1580	18.36	7180	83.42	1427	16.58
10. යාපනය	1	0	0.00	0	0.00	0	0.00	0	0.00	0	0.00	1	100
11. කිලිනොච්චි	0	0	0.00	0	0.00	0	0.00	0	0.00	0	0.00	0	0.00
12. මන්නාරම	0	0	0	0	0	0	0	0	0	0	0	0	0
13. වව්නියාව	183	38	20.77	38	20.77	48	26.23	35	19.13	159	86.89	24	13.11
14. මුලතිව්	1	1	100	0	0.00	0	0.00	0	0.00	1	100	0	0.00
15. මඩකලපුව	0	0	0.00	0	0.00	0	0.00	0	0.00	0	0.00	0	0.00
16. අම්පාර	3826	577	15.08	702	18.35	1063	27.78	838	21.90	3180	83.12	646	16.88
17. ත්‍රිකුණාමලය	1389	197	14.18	258	18.57	416	29.95	245	17.64	1116	80.35	273	19.65
18. කුරුණෑගල	19662	4656	23.68	4162	21.17	5232	26.61	3352	17.05	17402	88.51	2260	11.49
19. පුත්තලම	7199	1479	20.54	1379	19.16	2051	28.49	1410	19.59	6319	87.78	880	12.22
20. අනුරාධපුරය	10786	1967	18.24	2094	19.41	2947	27.32	2021	18.74	9029	83.71	1757	16.29
21. පොළොන්නරුව	4719	768	16.27	866	18.35	1256	26.62	960	20.34	3850	81.59	869	18.41
22. බදුල්ල	10134	1906	18.81	1934	19.08	2803	27.66	1948	19.22	8591	84.77	1543	15.23
23. මොනරාගල	6346	922	14.53	1091	17.19	1616	25.46	1322	20.83	4951	78.02	1395	21.98
24. රත්නපුරය	13218	2667	20.18	2434	18.41	3465	26.21	2464	18.64	11030	83.45	2188	16.55
25. කෑගල්ල	9314	1939	20.82	2003	21.51	2555	27.43	1571	16.87	8068	86.62	1246	13.38
සමස්ත දිවයින	**211086**	**49007**	**23.22**	**40699**	**19.28**	**52929**	**25.07**	**36765**	**17.42**	**179400**	**84.98**	**31686**	**15.01**

වගුව 3

1.2.4 ප්‍රථම වරට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව

අධ්‍යාපන කලාපය	පෙනී සිටි සංඛ්‍යාව	විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ		අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ		සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ		සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ		සමත් (A+B+C+S)		දුර්වල (W)	
		සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
1. කොළඹ	11439	4620	40.39	2022	17.68	2107	18.42	1344	11.75	10093	88.23	1346	11.77
2. හෝමාගම	3480	693	19.91	640	18.39	869	24.97	603	17.33	2805	80.60	675	19.40
3. ශ්‍රී ජයවර්ධනපුර	6881	2003	29.11	1398	20.32	1610	23.40	1043	15.16	6054	87.98	827	12.02
4. පිළියන්දල	5630	1411	25.06	1182	20.99	1317	23.39	931	16.54	4841	85.99	789	14.01
5. ගම්පහ	7113	2406	33.83	1413	19.87	1442	20.27	994	13.97	6255	87.94	858	12.06
6 මිනුවන්ගොඩ	4666	945	20.25	906	19.42	1182	25.33	870	18.65	3903	83.65	763	16.35
7. මීගමුව	6510	1192	18.31	1208	18.56	1713	26.31	1281	19.68	5394	82.86	1116	17.14
8. කැලණිය	6325	1402	22.17	1230	19.45	1611	25.47	1131	17.88	5374	84.96	951	15.04
9. කළුතර	6115	1611	26.35	1138	18.61	1348	22.04	1054	17.24	5151	84.24	964	15.76
10. මතුගම	2857	702	24.57	607	21.25	719	25.17	460	16.10	2488	87.08	369	12.92
11. හොරණ	4253	1231	28.94	819	19.26	930	21.87	685	16.11	3665	86.17	588	13.83
12. නුවර	6022	2362	39.22	1141	18.95	1275	21.17	704	11.69	5482	91.03	540	8.97
13. දෙනුවර	1506	178	11.82	247	16.40	420	27.89	372	24.70	1217	80.81	289	19.19
14. ගම්පොල	2263	256	11.31	397	17.54	587	25.94	499	22.05	1739	76.84	524	23.16
15. තෙල්දෙනිය	1494	176	11.78	268	17.94	399	26.71	299	20.01	1142	76.44	352	23.56
16. වත්තේගම	1592	284	17.84	317	19.91	494	31.03	276	17.34	1371	86.12	221	13.88
17. කටුගස්තොට	2033	291	14.31	408	20.07	601	29.56	400	19.68	1700	83.62	333	16.38
18. මාතලේ	2481	630	25.39	507	20.44	610	24.59	418	16.85	2165	87.26	316	12.74
19. ගලේවෙල	1847	249	13.48	345	18.68	553	29.94	348	18.84	1495	80.94	352	19.06
20. නාඋල	445	66	14.83	84	18.88	130	29.21	83	18.65	363	81.57	82	18.43
21. විල්ගමුව	512	54	10.55	73	14.26	130	25.39	124	24.22	381	74.41	131	25.59
22. නුවරඑළිය	630	87	13.81	87	13.81	192	30.48	143	22.70	509	80.79	121	19.21
23. කොත්මලේ	748	169	22.59	135	18.05	175	23.40	157	20.99	636	85.03	112	14.97
24. හැටන්	757	158	20.87	163	21.53	189	24.97	148	19.55	658	86.92	99	13.08
25. වලපනේ	916	140	15.28	193	21.07	203	22.16	187	20.41	723	78.93	193	21.07
26. හඟුරන්කෙත	1437	229	15.94	273	19.00	433	30.13	267	18.58	1202	83.65	235	16.35
27. ගාල්ල	6633	2216	33.41	1243	18.74	1398	21.08	889	13.40	5746	86.63	887	13.37
28. ඇල්පිටිය	3055	555	18.17	594	19.44	857	28.05	507	16.60	2513	82.26	542	17.74
29. අම්බලන්ගොඩ	3406	844	24.78	626	18.38	775	22.75	594	17.44	2839	83.35	567	16.65
30. උඩුගම	1711	316	18.47	327	19.11	455	26.59	302	17.65	1400	81.82	311	18.18
31. මාතර	4811	1481	30.78	868	18.04	1004	20.87	728	15.13	4081	84.83	730	15.17
32. අකුරැස්ස	1892	415	21.93	364	19.24	456	24.10	368	19.45	1603	84.73	289	15.27
33. මුලටියන-හක්මන	2080	361	17.36	440	21.15	542	26.06	403	19.38	1746	83.94	334	16.06
34. මොරවක-දෙනියාය	2161	401	18.56	431	19.94	551	25.50	407	18.83	1790	82.83	371	17.17

අධ්‍යාපන කලාපය	පෙනී සිටි සංඛ්‍යාව	විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ		අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ		සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ		සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ		සමත් (A+B+C+S)		දුර්වල (W)	
		සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%	සංඛ්‍යාව	%
35. තංගල්ල	2437	519	21.30	508	20.85	607	24.91	403	16.54	2037	83.59	400	16.41
36. හම්බන්තොට	3683	652	17.70	666	18.08	973	26.42	740	20.09	3031	82.30	652	17.70
37. වලස්මුල්ල	2487	585	23.52	470	18.90	620	24.93	437	17.57	2112	84.92	375	15.08
38. යාපනය	1	0	.00	0	.00	0	.00	0	.00	0	.00	1	100.00
39. දූපත්	0	0	0	0	0	0	0	0	0	0	0	0	0
40. තෙන්මාරච්චි	0	0	0	0	0	0	0	0	0	0	0	0	0
41. වලිකාමම්	0	0	0	0	0	0	0	0	0	0	0	0	0
42. වඩමරච්චි	0	0	0	0	0	0	0	0	0	0	0	0	0
43. කිලිනොච්චි	0	0	0	0	0	0	0	0	0	0	0	0	0
44. මන්නාරම	0	0	0	0	0	0	0	0	0	0	0	0	0
45. මඩු	0	0	0	0	0	0	0	0	0	0	0	0	0
46. වව්නියාව	183	38	20.77	38	20.77	48	26.23	35	19.13	159	86.89	24	13.11
47. වව්නියාව උතුර	0	0	0	0	0	0	0	0	0	0	0	0	0
48. මුලතිව්	0	0	0	0	0	0	0	0	0	0	0	0	0
49. තුනුක්කායි	1	1	100	0	.00	0	.00	0	.00	1	100	0	.00
50. මඩකලපුව	0	0	0	0	0	0	0	0	0	0	0	0	0
51. කල්කුඩා	0	0	0	0	0	0	0	0	0	0	0	0	0
52. පදිරිප්පු	0	0	0	0	0	0	0	0	0	0	0	0	0
53. මඩකලපුව මධ්‍යම	0	0	0	0	0	0	0	0	0	0	0	0	0
54. අම්පාර	2225	375	16.85	447	20.09	627	28.18	456	20.49	1905	85.62	320	14.38
55. කල්මුනේ	0	0	0	0	0	0	0	0	0	0	0	0	0
56. සමන්තුරෙයි	0	0	0	0	0	0	0	0	0	0	0	0	0
57. මහඔය	584	44	7.53	72	12.33	173	29.62	177	30.31	466	79.79	118	20.21
58. දෙහිඅත්තකණ්ඩිය	1010	157	15.54	183	18.12	263	26.04	200	19.80	803	79.50	207	20.50
59. තිරුක්කෝවිල්	7	1	14.29	0	.00	0	.00	5	71.43	6	85.71	1	14.29
60. අක්කරෙයිපත්තුව	0	0	0	0	0	0	0	0	0	0	0	0	0
61. ත්‍රිකුණාමලය	322	55	17.08	60	18.63	87	27.02	56	17.39	258	80.12	64	19.88
62. මුතූර්	3	0	.00	0	.00	1	33.33	0	.00	1	33.33	2	66.67
63. කන්තලේ	742	120	16.17	144	19.41	230	31.00	125	16.85	619	83.42	123	16.58
64. ත්‍රිකුණාමලය (උතුර)	322	22	6.83	54	16.77	98	30.43	64	19.88	238	73.91	84	26.09
65. කින්නියා	0	0	0	0	0	0	0	0	0	0	0	0	0
66. කුරුණෑගල	4894	1528	31.22	1008	20.60	1149	23.48	738	15.08	4423	90.38	471	9.62
67. කුලියාපිටිය	3427	960	28.01	768	22.41	871	25.42	548	15.99	3147	91.83	280	8.17
68. නිකවැරටිය	2602	515	19.79	561	21.56	723	27.79	471	18.10	2270	87.24	332	12.76
69. මහව	3113	579	18.60	574	18.44	935	30.04	621	19.95	2709	87.02	404	12.98
70. ගිරිඋල්ල	3086	594	19.25	746	24.17	902	29.23	491	15.91	2733	88.56	353	11.44
71. ඉබ්බාගමුව	2540	480	18.90	505	19.88	652	25.67	483	19.02	2120	83.46	420	16.54
72. පුත්තලම	2523	297	11.77	461	18.27	781	30.96	581	23.03	2120	84.03	403	15.97
73. හලාවත	4676	1182	25.28	918	19.63	1270	27.16	829	17.73	4199	89.80	477	10.20

අධ්‍යාපන කලාපය	පෙනී සිටි සංඛ්‍යාව	විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ		අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ		සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ		සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ		සමත් (A+B+C+S)		දුර්වල (W)	
		ලබාගත් සිසු සංඛ්‍යාව	%	ලබාගත් සිසු සංඛ්‍යාව	%	ලබාගත් සිසු සංඛ්‍යාව	%	ලබාගත් සිසු සංඛ්‍යාව	%	ලබාගත් සිසු සංඛ්‍යාව	%	ලබාගත් සිසු සංඛ්‍යාව	%
74. අනුරාධපුරය	3867	987	25.52	784	20.27	921	23.82	642	16.60	3334	86.22	533	13.78
75. තඹුත්තේගම	1935	309	15.97	416	21.50	561	28.99	354	18.29	1640	84.75	295	15.25
74. කැකිරාව	1954	273	13.97	361	18.47	630	32.24	367	18.78	1631	83.47	323	16.53
75. ගලෙන්බිඳුනුවැව	1415	163	11.52	238	16.82	385	27.21	331	23.39	1117	78.94	298	21.06
76. කැබිතිගොල්ලෑව	1615	235	14.55	295	18.27	450	27.86	327	20.25	1307	80.93	308	19.07
77. පොළොන්නරුව	1303	262	20.11	205	15.73	344	26.40	266	20.41	1077	82.66	226	17.34
78. හිඟුරක්ගොඩ	2049	373	18.20	386	18.84	513	25.04	388	18.94	1660	81.02	389	18.98
79. දිඹුලාගල	1367	133	9.73	275	20.12	399	29.19	306	22.38	1113	81.42	254	18.58
80. බදුල්ල	2833	590	20.83	567	20.01	740	26.12	499	17.61	2396	84.57	437	15.43
81. බණ්ඩාරවෙල	2462	644	26.16	480	19.50	660	26.81	423	17.18	2207	89.64	255	10.36
82. මහියංගනය	2001	257	12.84	303	15.14	559	27.94	434	21.69	1553	77.61	448	22.39
83. වැලිමඩ	2209	318	14.40	446	20.19	667	30.19	471	21.32	1902	86.10	307	13.90
84. පස්සර	629	97	15.42	138	21.94	177	28.14	121	19.24	533	84.74	96	15.26
85. මොනරාගල	2083	309	14.83	386	18.53	505	24.24	410	19.68	1610	77.29	473	22.71
86. වැල්ලවාය	2799	419	14.97	449	16.04	749	26.76	573	20.47	2190	78.24	609	21.76
87. බිබිල	1464	194	13.25	256	17.49	362	24.73	339	23.16	1151	78.62	313	21.38
88. රත්නපුර	5565	1574	28.28	1032	18.54	1287	23.13	897	16.12	4790	86.07	775	13.93
89. බලන්ගොඩ	2304	357	15.49	441	19.14	634	27.52	471	20.44	1903	82.60	401	17.40
90. නිවිතිගල	2220	245	11.04	406	18.29	693	31.22	466	20.99	1810	81.53	410	18.47
91. ඇඹිලිපිටිය	3129	491	15.69	555	17.74	851	27.20	630	20.13	2527	80.76	602	19.24
92. කෑගල්ල	3974	1037	26.09	893	22.47	991	24.94	592	14.90	3513	88.40	461	11.60
93. මාවනැල්ල	2591	406	15.67	509	19.64	722	27.87	491	18.95	2128	82.13	463	17.87
94. දෙහිඕවිට	2749	496	18.04	601	21.86	842	30.63	488	17.75	2427	88.29	322	11.71
සමස්ත දිවයින	**211086**	**49007**	**23.22**	**40699**	**19.28**	**52929**	**25.07**	**36765**	**17.42**	**179400**	**84.98**	**31686**	**15.01**

වගුව 4

1.2.5 ලකුණු ලබාගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව

පන්ති ප්‍රාන්තරය	සංඛ්‍යාතය	සංඛ්‍යාත ප්‍රතිශතය	සමුච්චිත සංඛ්‍යාතය	සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය
91 - 100	426	0.18	241124	100.00
81 - 90	14631	6.07	240698	99.82
71 - 80	37920	15.73	226067	93.76
61 - 70	44554	18.48	188147	78.03
51 - 60	45194	18.74	143593	59.55
41 - 50	36275	15.04	98399	40.81
31 - 40	27770	11.52	62124	25.76
21 - 30	18748	7.77	34354	14.24
11 - 20	11095	4.60	15606	6.47
01 - 10	4506	1.87	4511	1.87
00 - 00	5	0.00	5	0.00

වගුව 5

ඉහත වගුවෙන් තොරතුරු ලබාගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා :- සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් 241124 අතුරෙන් 31 - 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබාගත් සංඛ්‍යාව 27770 කි. එය ප්‍රතිශතයක් වශයෙන් 11.52% කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති සංඛ්‍යාව 62124 ක් වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 25.76% කි.

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය



ප්‍රස්තාරය 1 (RD/16/05/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා අකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා :- අයදුම්කරුවන් වැඩිම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ අංක 4 ප්‍රශ්නයටයි. එම ප්‍රතිශතය 95% කි. එමෙන්ම අයදුම්කරුවන් අඩුම සංඛ්‍යාවක් නිවැරදිව පිළිතුරු සපයා ඇත්තේ අංක 8 ප්‍රශ්නයටයි. එම ප්‍රතිශතය 12% කි.

1.3.2 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය



මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා :- මෙම ප්‍රශ්න පත්‍රයෙහි සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. එහෙත් වැඩිම වශයෙන් පිළිතුරු සපයනු ලැබූ අංක 1 ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් 98%ක් පිළිතුරු සපයා තිබූ අතර අඩුම වශයෙන් පිළිතුරු සපයනු ලැබූ අංක 5 ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා තිබුණේ අයදුම්කරුවන්ගෙන් 91%ක් පමණි.

ප්‍රස්තාරය 2 (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

1.3.3 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය



මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා :- අංක 1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු 20න් 76% - 100% ප්‍රාන්තරයේ එනම් ලකුණු 16 සිට 20 තෙක් ලබා ගත් ප්‍රතිශතය 17% කි. එමෙන්ම වෙන් කර ඇති ලකුණු 20න් 0% - 25% ප්‍රාන්තරයෙහි එනම් ලකුණු 0 සිට 5 තෙක් ලබාගත් ප්‍රතිශතය 27% කි.

ප්‍රස්තාරය 3 (RD/16/04/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

1.3.4 **II** ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය



ප්‍රස්තාරය 4 (RD/16/04/OL පෙර්ම්මයෙන් ලබාගත් කොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)
ඉහත ප්‍රස්තාරයෙන් කොරතුරු ලබාගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.
උදා : අංක 1 ප්‍රශ්නයෙහි i කොටසෙහි පහසුතාව 49%කි. වැඩිම පහසුතාව ඇත්තේ අංක 1 ප්‍රශ්නයේ (v) (අ) අනුකොටසටයි. එහි පහසුතාව 88%කි.
එමෙන්ම අඩුම පහසුතාව ඇත්තේ අංක 1 ප්‍රශ්නයේ (viii) (අ) අනුකොටසට හා අංක 2 ප්‍රශ්නයේ (අා) අනුකොටසටයි. එවායේ පහසුතා 27% බැගින්

1.3.5 III ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය



මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා : මෙහි මුල් ප්‍රශ්න හතරට පිළිතුරු සැපයීම අනිවාර්ය වුව ද අංක 1 ප්‍රශ්නය සඳහා 98%ක් ද අංක 3 ප්‍රශ්නය සඳහා 86%ක් ද පමණක් පිළිතුරු සපයා ඇත. අංක 5, 6, 7 ප්‍රශ්න අතුරෙන් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතු අතර අංක 5 ප්‍රශ්නය සඳහා 15%ක් ද අංක 6 ප්‍රශ්නය සඳහා 43%ක් ද අංක 7 ප්‍රශ්නය සඳහා 34%ක් ද පිළිතුරු සපයා ඇත.

ප්‍රස්තාරය 5 (RD/16/02/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

1.3.6 III ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබාගෙන ඇති ආකාරය



මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා :- අංක 1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු 20න් 76% - 100% ප්‍රාන්තරයේ එනම් ලකුණු 16 සිට 20 තෙක් ලබා ගත් ප්‍රතිශතය 18% කි. එමෙන්ම වෙන් කර ඇති ලකුණු 20න් 0% - 25% ප්‍රාන්තරයෙහි එනම් ලකුණු 0 සිට 5 තෙක් ලබාගත් ප්‍රතිශතය 15% කි.

ප්‍රස්තාරය 6 (RD/16/04/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)



ප්‍රස්තාරය 7 (RD/16/04/OL පෝර්මයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබාගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා : අංක 1 ප්‍රශ්නයෙහි 1 (අ) කොටසෙහි පහසුතාව 55%කි. වැඩිම පහසුතාව ඇත්තේ අංක 1 ප්‍රශ්නයේ (iv)(අ) අනුකොටසට හා (vii)(අ) අනුකොටසටයි. ඒවායේ පහසුතා 92% බැගින් වේ. එමෙන්ම අඩුම පහසුතාව ඇත්තේ අංක 1 ප්‍රශ්නයේ (ii)(අ) අනුකොටසටයි. එහි පහසුතාව 22%ක් පමණි.

2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

ප්‍රශ්න පත්‍රවල ස්වභාවය

අ. පො. ස. (සා. පෙළ) විභාගයෙහි (21) සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයයෙහි ශිෂ්‍ය සාධනය ඇගයීම සඳහා ප්‍රශ්න පත්‍ර තුනක් ඉදිරිපත් කෙරේ. ඒවා අතුරින් I පත්‍රය සහ II පත්‍රය යන ප්‍රශ්න පත්‍ර දෙකම අපේක්ෂකයින්ට එක වර දෙනු ලබන අතර එම පත්‍ර දෙකම සඳහා නියමිත කාලය පැය තුනකි. සිංහල සාහිත්‍යය ආශ්‍රිත කුසලතා මැනීම සඳහා වෙනම දෙනු ලබන III පත්‍රය සඳහා නියමිත කාලය පැය දෙකකි.

අවසාන ලකුණු ගණනය කිරීම

I	පත්‍රය සඳහා	- ලකුණු	40
II	පත්‍රය සඳහා	- ලකුණු	80
III	පත්‍රය සඳහා	- ලකුණු	80
	එකතුව	- ලකුණු	200

අවසාන ලකුණ - $200 \div 2 = 100$

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1. I ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය

* මුළු ලකුණු 40 කි.
* වරණ හතර බැගින් ඇති බහුවරණ ප්‍රශ්න 40 කින් සමන්විත වේ. එම එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3) හා (4) වරණවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ වරණය තේරීම අපේක්ෂා කෙරේ.
* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයීම අපේක්ෂිත ය.
* සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයය යටතේ,
  භාෂා කුසලතා,
  වියරණ භාවිතය පිළිබඳ කුසලතා,
  භාෂා සාහිත්‍යය පිළිබඳ කුසලතා සහ
  විශ්ලේෂණය හා අවබෝධය පිළිබඳ කුසලතා
  මැනීමේ අරමුණින් මෙම බහුවරණ ප්‍රශ්න 40 සකස් කර ඇත.

2.1.2 **I ප්‍රශ්න පත්‍රය**

- අංක **1** සිට **4** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **සදහන් අතුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට **වඩාත් සමීප අර්ථය** දෙන වරණය තෝරන්න.

1. **අහසේ මාලිමා තැබීම** කෙනකුගේ දියුණුවට හිතකර නො වේ.
   (1) තමන්ට නොලැබෙන දේ ගැන සිතින් මවා ගැනීම (2) තමන් වෙනුවෙන් වාසියක් සලසා ගැනීම
   (3) අනුන්ගෙන් උදව් ඉල්ලා සිටීම (4) තමන්ට කළ නොහැකි දේවල් ගැන පසුතැවීම

2. තරුණ සමිතියේ ලේකම්තුමා **කෙස්ද තන්ද කිරීමට** රුසියෙකි.
   (1) කඳු කපා සමතලා කිරීමට (2) නිර්මාණාත්මක හැකියාව ප්‍රදර්ශනයට
   (3) කුඩා දෙයක් විශාල කොට කීමට (4) අනුන් මුළා කිරීමට

3. නිලධාරීන් කරන සමහර වැඩවලට සුදුහුනු ගෑම නොකළ යුතු බව සමිතියේ සාමාජිකයෝ අවධාරණය කළහ.
   (1) උදව් කිරීම (2) වැරදි වසන් කිරීම
   (3) වර්ණනා කිරීම (4) අලංකාරවත් කිරීම

4. විවිධ උවදුරු නිසා **මුළු සේසත ම නැතිවුණත්** ඔහු දිරියෙන් ජීවිතය ජය ගත්තේ ය.
   (1) සිය මිතුරන් අහිමි වුවත් (2) නිවසේ තිබූ කොඩි හා සේසත් නැති වුවත්
   (3) සියලු සැප සම්පත් අහිමි වුවත් (4) යාන වාහන ආදිය සොරු පැහැරගෙන ගියත්

- අංක **5** සිට **7** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට **වඩාත් සුදුසු** පදය තෝරන්න.

5. විද්‍යා විෂයය සම්බන්ධයෙන් ඔහුට ඇත්තේ ..... කුසලතාවකි.
   (1) විස්මයාවහ (2) දූරදර්ශී (3) දයාර්ද්‍ර (4) හාස්‍යජනක

6. හදිසියේ පැනනැගුණු ගැටලු නිසා ඔහු ..... විය.
   (1) අනවජ්ඤ (2) ඕසුලිත (3) විස්මෘත (4) වික්ෂිප්ත

7. මහු ඉතා වැදගත් කාර්යයක ..... ව සිටියි.
   (1) ව්‍යාප්ත (2) ව්‍යාවෘත (3) නිර්වෘත (4) ආවෘත

8. 'රුසියානු' යන වචනයේ ඇති **පිල්ලම් කිවැරදී ව** අනුපිළිවෙළින් දක්වෙන වරණය තෝරන්න.
   (1) පාපිල්ල, ඉස්පිල්ල, ඇදපිල්ල, පාපිල්ල (2) පාපිල්ල, ඉස්පිල්ල, ඇලපිල්ල, පාපිල්ල
   (3) ඇදපිල්ල, ඉස්පිල්ල, ඇලපිල්ල, පාපිල්ල (4) ඇලපිල්ල, ඉස්පිල්ල, ඇදපිල්ල, පාපිල්ල

- අංක **9** සහ **10** ප්‍රශ්නවල සෑම පදයක ම **අක්ෂර විකෘතාභය කිවැරදී ව** දක්වෙන වරණය තෝරන්න.

9. (1) පෙළපාළි, ප්‍රශංසාව, ශ්‍රේෂ්ඨ, සැළකිල්ල (2) ස්වර්ණාභරන, නිළඹිර, අභිවාදනය, ව්‍යංගාර්ථය
   (3) දේශගුණය, නිෂ්පාදනය, බුද්ධිගෝචර, සාමර්ථ්‍යය (4) සරල, ප්‍රථිඵලය, අභිනිෂ්ක්‍රමණය, අනභිවර්ණීය

10. (1) වීක්ෂණෙ, පලාන, ප්‍රස්තාව, ප්‍රථිඥව (2) යථාර්ථවාදී, හෘදයංගම, දිලිසෙන, ප්‍රෞඪ
    (3) පරිශීලනය, වන්පිළිවෙත්, කැළඹීම, ප්‍රකාශණය (4) අභිලාශය, සම්ප්‍රධාය, පාරිභෝගික, නිරූපණය

11. අකාරාදි පිළිවෙළට වචන යෙදී ඇති වරණය තෝරන්න.
    (1) කවුඩු, කසින, කසුන්, කපාල (2) ගරාදි, ගරුඬ, ගගන, ගදුඹු
    (3) ගොඩැලි, ගොදුරු, ගොකවු, ගොහොරු (4) කැසිරි, කැකුළු, කැවුම්, කැහැටු

12. කොමාව සහ ප්‍රශ්නාර්ථ ලකුණ **කිවැරදී ව** යෙදී ඇති වරණය තෝරන්න.
    (1) කුමක් සඳහා ද ? ඔබ, ගමට ගියේ (2) කුමක් සඳහා ද, ඔබ ගමට ගියේ ?
    (3) කුමක් සඳහා, ද ඔබ ගමට ගියේ ? (4) කුමක් ? සඳහා ද ඔබ ගමට ගියේ,

13. මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
    (1) පද්ම - කමල, තඹුරු, උසුල්, සියපත්
    (2) දිනිනි - ස්ත්‍රිය, මව, ජනනී, අමදිනි
    (3) සාණ - උනෙ, ණය, හීන, හර
    (4) පොළොව - දෙරණ, ධරණී, මිහි, මේදිනී

14. මුලින් දී ඇති පදයට **විරුද්ධාර්ථයක් නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) අසතුටු - ආහ්ලාදය, ප්‍රහාසය, ප්‍රමෝද්‍යය, තුෂ්ටිය (2) සත්‍ය - අසත්‍ය, සාවද්‍ය, බොරු, මිථ්‍යා
(3) නිර්ධන - සධන, ධනවත්, සවස්තුක, පොහොසත් (4) රාගී - විරාගී, විරහී, විරමණ, සරාගී

- අංක **15** සිට **17** තෙක් ප්‍රශ්නවල **හදකළු අකුරෙන්** මුද්‍රිත කොටසට වඩාත් සමීප අදහස සහිත වරණය තෝරන්න.

15. එම ක්‍රියාවලිය **අනවරතයෙන්** සිදුවන්නකි.
(1) විරතිවර (2) අනිවාර්යයෙන් (3) නිරන්තරයෙන් (4) අනුපිළිවෙළින්

16. එම යන්ත්‍රය **ස්වයංක්‍රීය ව** ක්‍රියාත්මක වේ.
(1) කිසිකෙනෙකු නොදනුවත් ව (2) බාහිර මෙහෙයවීමක් නොමැති ව
(3) කම්පනයක් සහිත ව (4) විදුලියෙන් පණගැන්වීමක් සහිත ව

17. තෝරාගත් මාතෘකාව පිළිබඳ තොරතුරු තව දුරටත් **තවිෂණය** කළ යුතු බව කාගේත් අදහස විය.
(1) ගැඹුරින් සොයා බැලීම (2) කෙටිකර දැක්වීම
(3) සවිස්තරාත්මක ව දැක්වීම (4) නිවැරදි ව ඉදිරිපත් කිරීම

18. **අවසය සමාසය** සඳහා උදාහරණයක් සහිත වරණය තෝරන්න.
(1) ඇළහැළ (2) සහසැප් (3) අස්පිර (4) කිරිබත්

19. 'හෙපොංගල් උත්සවයේ තෙවන දිනයේ දී ගවයාට කෙළෙහිගුණ දැක්වීම සිදුකෙරේ.'
ඉහත වාක්‍යයේ අන්තර්ගත **කෘදන්ත** පදයක් වන්නේ,
(1) 'උත්සවය' යන්නයි. (2) 'දැක්වීම' යන්නයි. (3) 'සිදුකෙරේ' යන්නයි. (4) 'තෙවන' යන්නයි.

20. 'කාන්තාව' යන පදයේ **අසියමාර්ථ ස්තවවන අනුක්ත** පදය සහිත වරණය තෝරන්න.
(1) කාන්තාවන් (2) කාන්තාවක් (3) කාන්තාවක (4) කාන්තාවෝ

21. **මිශ්‍රක්‍රියා** පදයක් සහ **චිධිළියා** පදයක් පිළිවෙළින් යෙදී ඇති වාක්‍යය තෝරන්න.
(1) පය ඉක්මන්කර හෙදර යන්න. (2) මහ තොරතුරු දන පිටත්වන්න.
(3) වෙණ වයන්න; ගී ගයන්න. (4) ගී අසමින් ගමන යන්න.

22. 'වැඳ ඔහු පද කමල
තමා ආ තනු කීය මුසිල'
ඉහත පද්‍ය අර්ථයෙහි '**වැඳ**' යනු
(1) පූර්ව ක්‍රියාවකි. (2) විධි ක්‍රියාවකි. (3) ප්‍රයෝජ්‍ය ක්‍රියාවකි. (4) ආශීර්වාද ක්‍රියාවකි.

23. 'සිසිවන වුවන ඉහ සුහ ගතහැකි මිටින' යන පද්‍ය පාදයේ '**සිසිවන වුවන**' යනු
(1) යුගල පදයකි. (2) අභියෝක්තියකි. (3) රූපකයකි. (4) උපමාවකි.

24. 'අන්තර්ජාතික' යන වචනයෙහි '**අන්තර්**' යනු
(1) නිපාතයකි. (2) උපසර්ගයකි. (3) තද්ධිතයකි. (4) විශේෂණයකි.

25. ධන + ඊශ්වර, පර + උපකාර, අභි + අන්න, සුභ + උත්සව යන පද නිවැරදි ලෙස සන්ධි කර ඇති වරණය තෝරන්න.
(1) ධනේශ්වර, පරෝපකාර, අභ්‍යන්න, සුභෝත්සව
(2) ධනීශ්වර, පරූපකාර, අභ්‍යන්න, සුභෝත්සව
(3) ධනීශ්වර, පරූපකාර, අභ්‍යන්න, සුභෝත්සව
(4) ධනේශ්වර, පරෝපකාර, අභ්‍යන්න, සුභෝත්සව

- අංක **26** සිට **28** තෙක් ඇති ප්‍රස්තාව පිරුළු සඳහා වඩාත් ගැළපෙන අදහස ඇති වරණය තෝරන්න.

26. 'ඇම ගිල්ල මාළුවා වගෙයි'
(1) සිදු වූ වැරැද්දට පිළියම් නොමැති වීම
(2) ඇමක් භාවිත කර මසුන් අල්ලා ගැනීම
(3) ගැළවීමට අපහසු ලෙස යමක හිරවීම
(4) කරදර අතරට තවත් කරදර එකතුවීම

27. 'පාළු ගෙයි වළං බිඳින්නා වාගෙයි'
(1) විරුද්ධකාරයන් නොමැති කැත ස්වාමිතනය මත කටයුතු කිරීම
(2) කතාවේ තරමට ක්‍රියාවෙන් කටයුතු නොකිරීම
(3) නිශ්ශබ්දතාව ආරක්ෂා කළයුතු තැන එය කඩ කිරීම
(4) අවශ්‍යතාව ඇත්නම් නොකළ හැකි දෙයක් නොමැති වීම

28. 'කිරි මුහුදට හද පැව්වා වගේ'
(1) යහපත් යමක් ඉටුකිරීමට ගොස් අයහපත් දෙයක් සිදුවීම
(2) කෙනකුගේ යහපත් ගුණ මනාව ප්‍රදර්ශනය වීම
(3) අවශ්‍ය නැත දී පමණක් ක්‍රියාත්මක වීම
(4) සිදුවිය නොහැකි දෙයක් පිළිබඳ විස්තර කිරීම

- අංක **29** සිට **32** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි දී ඇති වාක්‍ය අතුරෙන් ව්‍යාකරණානුකූල ව **නිවැරදි** වාක්‍යය තෝරන්න.

29. (1) මම යහපත් සුරවැසියකු වන්නෙමි.
(2) මිනුත්, මමත් ප්‍රදර්ශනය නැරඹීමට යන්නෙමි.
(3) සිසුනු පස්දෙනෙක් ජයග්‍රහණ ලැබුහ.
(4) මා උගන් පාසලේ දක්ෂ ක්‍රීඩකයන් ඇත.

30. (1) එක් අයෙක් විවාද කණ්ඩායමෙන් ඉවත් වූහ.
(2) සියොත් කැල මිහිරි හඬින් නද දෙයි.
(3) හිරු කිරණ වැදුණු පියුමිනු විකසිත වෙයි.
(4) අය්යා හෝ මම හෝ නගරයට යන්නෙමු.

31. (1) රියදුරන් පාරේ පරෙස්සමෙන් රිය ධාවනය කළ යුත්තෝ ය.
(2) මිනිසුන් වුවමනාවෙන් ම ඩෙංගු මදුරුවෝ බෝකරති'යි සෞඛ්‍ය පරීක්ෂකවරයා පැවසී ය.
(3) ඇත්තු සමග පැටවුන් ද වනයේ සැරිසරති.
(4) අප නිහතමානී වුවහොත් සියල්ලෝ ම අපට ආදරය කරති.

32. (1) වෛද්‍යවරියක වූ රාධා දක්ෂ ලේඛිකාවක් ද වූවා ය.
(2) ක්‍රීඩකයෝ ක්‍රීඩාපිටියේ පුහුණු වනවා මම දුටිමි.
(3) සමුළුව සඳහා රාජ්‍ය නායකයෝ පැමිණ ඇත.
(4) උදේ සවස දෙමාපියෝ නැමදීම මැනවි.

33. ටිවර වෘත්තියේ දී 'හැන්නැදි රාල' යනුවෙන් හැඳින්වෙන්නේ,
(1) මිරුවේ ගමන් කරන්නන් අතර නායකයා ය.
(2) මිරුවේ හිමිකරු ය.
(3) ටිවර වාඩියක නායකයා ය.
(4) ටිවර ගමක ප්‍රධානියා ය.

- අංක **34** සිට **36** තෙක් ඇති ප්‍රශ්නවල මුලින් දී ඇති වාක්‍යයේ අර්ථයට වඩාත් සමීප අර්ථය සහිත වාක්‍යය තෝරන්න.

34. 'ස්වභාව ධර්මය සකස් වී ඇත්තේ සාමය හා සමඟිය උදෙසා වන අතර අසමඟිය මිනිසා විසින් නිර්මාණය කරගත්තකි.'
(1) සොබාදහම සාමයත් සමඟියත් වෙනුවෙන් සකස් වී ඇතත් මිනිසා අසමඟිය නිර්මාණය කර ඇත.
(2) සාමයත් සමඟියත් සොබාදහමින් ලැබුණත් මිනිසා අසමඟිය පතුරුවයි.
(3) අසමඟිය මිනිසාගේ නිර්මාණයක් වන අතර සාමය හා සමඟිය පරිසරයේ නිර්මාණයකි.
(4) සොබාදහම මඟින් සාමය හා සමඟිය මුර්තිමත් වන අතර අසමඟිය මිනිසාගෙන් මුර්තිමත් වේ.

35. 'බස කෙලෙසමින් පොත් ලියන්නවුන් මෙන් ම ඒ පොත් නුවා දක්වමින් උඩගෙඩි දෙන්නවුන් ද භාෂාවට කරන්නේ පරම හතුරුකමකි.'
(1) භාෂාව කෙලෙසමින් පොතපත ලියන අය ද ඒ සඳහා උදව් කරන අය ද භාෂා විනාශයට වගකිව යුතු ය.
(2) බස කෙලෙසමින් පොතපත ලියන අය ද එබදු පොත් අගය කරන අය ද බසට මහත් අවැඩක් සිදු කරති.
(3) භාෂාව කෙලෙසමින් පොත් ලියන අයත් ඒ පොත් පළකරමින් උදව් කරන අයත් පරම හතුරෝ වෙති.
(4) භාෂාවේ රිති නොසලකමින් පොත් ලියන අය ද ඒ පොත් පරිශීලනය කරන අය ද භාෂාවේ විනාශයට වගකිව යුතු ය.

36. 'ආයුර්වේද වෛද්‍ය ක්‍රමයෙන් කෙරෙන්නේ ජීවභාව ධර්මය සහ මිනිසා අතර ඇති උත්තරීතර බැඳීමට හානියක් නොකර ජීවිත ගමන ගෙනයාමට රුකුලක් වීමයි.

(1) සොබාදහම් හා මිනිසා අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්ධතාව රැකගනිමින් ජීවත්වීමට අවශ්‍ය පහසුව සැලසීම ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ කාර්යභාරයයි.

(2) සොබාදහමින් මිනිසාත් එකට බැඳ තබමින් ජීවිතය ගෙන යාමට අවශ්‍ය උපකාරය කෙරෙන්නේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමයෙනි.

(3) ආයුර්වේදයේ අරමුණ මිනිසා හා සොබා දහම අතර ඇති බැඳීම කඩ නොකොට ජීවත්වීමට අවශ්‍ය පහසුකම් සැලසීමයි.

(4) සොබාදහම හා මිනිසා අතර ඇති උතුම් බැඳීම සුරකිමින් ජීවත්වීමට අවශ්‍ය පහසුව සලසාදීම ආයුර්වේදයෙන් ඉටුකෙරෙයි.

37. පහත සඳහන් වාක්‍යය ලිඛිත ව්‍යවහාරයට හැරවූ විට වඩාත් **නිවැරදි වාක්‍යය** දක්වෙන වරණය තෝරන්න.
'අපි හොඳට පාඩම් කරන්නට ඇති කියල ගුරුතුමිය හිතුවා.'

(1) අප විසින් හොඳින් පාඩම් කරන ලදන'යි ගුරුතුමිය සිතුවෝ ය.
(2) අප හොඳින් පාඩම් කළන'යි ගුරුතුමිය සිතුවා ය.
(3) අප හොඳින් පාඩම් කරන ලදන'යි ගුරුතුමිය සිතුවා ය.
(4) අපි හොඳින් පාඩම් කරනි'යි ගුරුතුමිය සිතුවා ය.

38. 'සෙදනා ලොවිනා ලදුනා ලෙසිනා' යන පදය පාදයේ නිවැරදි අර්ථය දක්වෙන වරණය තෝරන්න.

(1) නාගලෝකයෙන් එකෙණෙහි ම ආවා වූ ස්ත්‍රීන් මෙන්
(2) නාගලෝකයෙන් ආවා වූ දිව්‍යමය නාග කන්‍යාවන් ලෙසින්
(3) ඇත් සමූහය අතරින් පැමිණි ඇතින්නියන් මෙන්
(4) වනා ස්නානය කොට පැමිණි කාන්තාවන් ලෙසින්

39. 'ලංකාවට පැමිණි විජය කුමරු ඇතුළු පිරිසට කපපැන් සංග්‍රහයක් ලැබී ඇති බව මහා වංශයේ සඳහන් වේ.' මෙහි **කසපැණ්** යනු

(1) කසාය (2) තුරුම්බා වතුර (3) සිසිල් පැන් (4) තේ පැන්

40. 'වැවේ රාජකාරිය' නැතහොත් මුල් මංගල්ලේ නමින් රජරට ගැමි වහරේ එන අභිචාරාත්මක පූජා විධිය පොදුවේ හැඳින්වෙන නාමය

(1) මුට්ටි නැමීම යි.
(2) කොහොඹ කළේ නැටීම යි.
(3) නාත්‍යාලය යි.
(4) දිය කැපීම යි.

**

2.1.3 I පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

ප්‍රශ්න අංකය	පිළිතුර	ප්‍රශ්න අංකය	පිළිතුර
01.	...1....	21.	...4....
02.	...3....	22.	...1....
03.	...2....	23.	...4....
04.	...3....	24.	...2....
05.	...1....	25.	...4....
06.	...4....	26.	...3....
07.	...2....	27.	...1....
08.	...2....	28.	...2....
09.	...3....	29.	...3....
10.	...2....	30.	...2....
11.	...4....	31.	...4...
12.	...2....	32.	...1....
13.	...1....	33.	...2....
14.	...4....	34.	...1....
15.	...3....	35.	...2....
16.	...2....	36.	...4....
17.	...1....	37.	...2....
18.	...3....	38.	...1....
19.	...2....	39.	...2....
20.	...3....	40.	...1....

නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 40කි.

2.1.4 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ (තේමා අනුව)



තේමාව	පහසුතාව වැඩිම ප්‍රශ්නය හා එහි පහසුතාව	පහසුතාව අඩුම ප්‍රශ්නය හා එහි පහසුතාව
භාෂා කුසලතා	4 (95%)	13 (13%)
ව්‍යාකරණ	21 (67%)	8 (12%)
භාෂා සාහිත්‍යය	–	–
විශ්ලේෂණය හා අවබෝධය	39 (61%)	40 (20%)



I ප්‍රශ්න පත්‍රය සැකසීමේදී පදනම් කරගනු ලැබූ තේමා හතර අතුරින්, පහසුතාව වැඩිම තේමාව භාෂා කුසලතාව වන අතර එහි පහසුතාව 58% කි. පහසුතාව අඩුම තේමාව භාෂා සාහිත්‍යය වන අතර එහි පහසුතාව 27% කි.

සමස්ත වශයෙන් I ප්‍රශ්න පත්‍රයෙහි පහසුතාව 48%කි.

2.1.5 I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්නවල වරණ තෝරා ඇති ආකාරය (ප්‍රතිශත ලෙස)

ප්‍රශ්න අංකය	නිවැරදි වරණය	එක් එක් වරණය තේරූ ශිෂ්‍ය ප්‍රතිශතය			
		පළමුවන වරණය	දෙවන වරණය	තෙවන වරණය	සිවුවන වරණය
1	1	**80%**	2%	1%	17%
2	3	1%	5%	**85%**	9%
3	2	12%	**76%**	11%	1%
4	3	1%	2%	**95%**	2%
5	1	**38%**	26%	12%	24%
6	4	21%	11%	25%	**43%**
7	2	15%	**21%**	53%	11%
8	2	3%	**12%**	72%	13%
9	3	17%	20%	**45%**	18%
10	2	7%	**36%**	21%	36%
11	4	18%	11%	11%	**60%**
12	2	26%	**63%**	8%	3%
13	1	**13%**	26%	51%	10%
14	4	34%	9%	15%	**42%**
15	3	15%	30%	**48%**	7%
16	2	11%	**78%**	2%	9%
17	1	**81%**	1%	14%	4%
18	3	14%	29%	**42%**	15%
19	2	15%	**37%**	28%	20%
20	3	7%	26%	**62%**	5%
21	4	14%	9%	10%	**67%**
22	1	**48%**	14%	9%	29%
23	4	6%	25%	42%	**27%**
24	2	11%	**25%**	16%	48%
25	4	17%	17%	9%	**57%**
26	3	36%	3%	**51%**	10%
27	1	**47%**	15%	32%	6%
28	2	7%	**73%**	7%	13%
29	3	56%	9%	**26%**	6%
30	2	13%	**57%**	20%	10%
31	4	8%	29%	26%	**37%**
32	1	**47%**	19%	21%	13%
33	2	22%	**34%**	29%	15%
34	1	**58%**	13%	14%	15%
35	2	17%	**40%**	27%	16%
36	4	17%	13%	26%	**44%**
37	2	12%	**28%**	31%	29%
38	1	**31%**	43%	8%	18%
39	2	25%	**61%**	9%	5%
40	1	**20%**	4%	25%	51%

සටහන : එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර දක්වා ඇත.

2.1.6 සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

මෙම ප්‍රශ්න පත්‍රයෙහි අංක 1, 2, 3, 4, 11, 12, 16, 17, 20, 21, 28 හා 39 ප්‍රශ්නවල පහසුතා 60% හෝ ඊට වඩා ඉහළ අගයක් ගනියි. එබැවින් මෙම ප්‍රශ්න 12 සිසුනට වඩා පහසුවෙන් ලකුණු උපයා ගත හැකි වූ ප්‍රශ්න ලෙස සැලකිය හැකි වෙයි.

එසේම අංක 5, 7, 8, 10, 13, 19, 23, 24, 29, 31, 33, 35, 37, 38 හා 40 ප්‍රශ්නවල පහසුතා 40% හෝ ඊට වඩා පහළ අගයක් ගනියි. එබැවින් මෙම ප්‍රශ්න 15 බොහෝ සිසුනට ලකුණු උපයා ගැනීමට දුෂ්කර වූ ප්‍රශ්න ලෙස සැලකිය හැකි වෙයි.

සිංහල භාෂාව හා සාහිත්‍යය I ප්‍රශ්න පත්‍රයේ අඩංගු බහුවරණ ප්‍රශ්න 40 පහත සඳහන් පරිදි භාෂා කුසලතා, ව්‍යාකරණ, භාෂා සාහිත්‍යය, විශ්ලේෂණය හා අවබෝධය යන තේමා හතර යටතේ සැකසී තිබුණි.

භාෂා කුසලතා පිළිබඳ ප්‍රශ්න	- 1, 2, 3, 4, 5, 6, 7, 12, 13, 14, 15, 16, 17, 26, 27, 28
ව්‍යාකරණ පිළිබඳ ප්‍රශ්න	- 8, 9, 10, 11, 18, 19, 20, 21, 22, 24, 25, 29, 30, 31, 32
භාෂා සාහිත්‍යය පිළිබඳ ප්‍රශ්න	- 23
විශ්ලේෂණය හා අවබෝධය පිළිබඳ ප්‍රශ්න	- 33, 34, 35, 36, 37, 38, 39, 40

භාෂා කුසලතා

මෙම ප්‍රශ්න පත්‍රයෙහි වැඩිම ප්‍රශ්න සංඛ්‍යාවක් එනම් ප්‍රශ්න 16ක් ම ඉදිරිපත් කර තිබුණේ "භාෂා කුසලතා" තේමාවෙනි. එනම් මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණුවලින් 40%ක් ම මෙම තේමාව සඳහා වෙන් වේ. ප්‍රශ්න පත්‍රයෙහි ඇති බහුවරණ ප්‍රශ්න 40 අතුරෙන් පහසුතම ප්‍රශ්නය අංක 4 වන අතර ඊළඟට පහසුම ප්‍රශ්න අනුපිළිවෙළින් අංක 2, අංක 17 හා අංක 1 වේ. මෙම වඩාත් පහසු ප්‍රශ්න හතරම "භාෂා කුසලතා" තේමාවට අයත් වන අතර ඒවායේ පහසුතා පිළිවෙළින් 95%, 85%, 81% හා 80% වේ. මෙම තේමාවට අයත් ප්‍රශ්න 16හි ම පහසුතා සලකා සමස්ත පහසුතාව ගණනය කළ විට "භාෂා කුසලතා" තේමාවෙහි පහසුතාව 58% වෙයි. සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයට පදනම් වී ඇති තේමා හතර අතුරින් පහසුතාව වැඩිම තේමාව ද මෙම තේමාවම වේ. මෙම තේමාවට අයත් ප්‍රශ්න අතුරින් දුෂ්කරම ප්‍රශ්න බවට පත්ව ඇත්තේ අංක 13, 7 හා 5 වේ. ඒවායේ පහසුතා පිළිවෙළින් 13%, 21% හා 38% වේ.

භාෂා කුසලතා තේමාව යටතේ ඇති ප්‍රශ්න අතුරෙන් අංක 13 ප්‍රශ්නය සඳහා අපේක්ෂකයින්ගේ පිළිතුරු වඩාත්ම අසාර්ථක වී ඇත. එම ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර අයත් පළමුවන වරණය තෝරා ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 13%ක් පමණි. මෙම ප්‍රශ්නය සඳහා වික්ෂේප ලෙස දී තිබූ දෙවැනි වරණය අපේක්ෂකයින්ගෙන් 26%ක් විසින් ද, තෙවැනි වරණය අපේක්ෂකයින්ගෙන් 51%ක් විසින් ද පිළිතුරු ලෙස සලකුණු කර තිබුණි.

මෙම ප්‍රශ්නයට පාදක වී තිබුණේ, දෙන ලද සුවිශේෂ පදයක් සඳහා ඒ සමඟ දී ඇති පද හතර අතර සමානාර්ථයක් නොදෙන පදයක් අඩංගු ද නැත්ද යන්න නිවැරදි ව විනිශ්චය කිරීමයි. පද්ම, දිනිති, සෘණ හා පොළව යන පද සඳහා සමානාර්ථ පද පිළිබඳ දැනුම මෙහිදී පරීක්ෂා කෙරුණු අතර ඒ පිළිබඳ ව බොහෝ අපේක්ෂකයින්ගේ දැනුම ප්‍රමාණවත් නොවූ බව ඔවුන්ගේ ප්‍රතිචාර ඇසුරින් පෙනී යයි. පර්යාය පද පිළිබඳ දැනුම වර්ධනය කර ගැනීම කෙරෙහි අපේක්ෂකයින්ගේ වැඩි අවධානයක් යොමු විය යුතු බව මෙම නිරීක්ෂණවලින් ගම්‍ය වේ.

අංක 07 ප්‍රශ්නය සඳහා සාර්ථකව පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 21%ක් පමණක් වන අතර, අපේක්ෂකයින්ගෙන් 53%ක් ම තෝරා ඇත්තේ වැරදි පිළිතුරක් අඩංගු වූ තෙවන වරණයයි. විභාගයට පෙනී සිටි 79%කට මෙම ප්‍රශ්නය සඳහා නිවැරදි ව පිළිතුරු සැපයීමට නොහැකිවීමෙන් ගම්‍ය වන්නේ ඔවුන්ගේ වාක් කෝෂයෙහි නොපුළුල් බවයි. පහසුතාව අඩු ප්‍රශ්නයක් වන අංක 5 ප්‍රශ්නය සඳහා අපේක්ෂකයින්ගෙන් 38%කට පමණක් නිවැරදි ව පිළිතුරු සැපයීමට හැකිවීමෙන් ද මෙම අදහස තහවුරු වේ. පුළුල් හා සාරවත් වාක් කෝෂයකට හිමිකම් ලැබීම සඳහා පරෙස්සමෙන් තෝරා ගන්නා ලද උසස් ගණයේ පත-පොත හා ලේඛන කියවීමෙහිත් එනයින් ඉගෙනීමට ලැබෙන වදන් භාවිතයෙහිත් පුරුද්ද අපේක්ෂකයින් විසින් තම ජීවිතයට එක්කර ගත යුතුය.

ව්‍යාකරණ

සිංහල භාෂාව හා සාහිත්‍යය I ප්‍රශ්න පත්‍රයෙහි ව්‍යාකරණ තේමාව යටතේ බහුවරණ ප්‍රශ්න 15ක් අඩංගු විය. එම ප්‍රශ්න සඳහා මුළු ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණුවලින් 37.5%ක්ම වෙන් වේ. මෙම තේමාවට අයත් ප්‍රශ්න අතුරෙන් වැඩිම පහසුතාව ඇත්තේ අංක 21 ප්‍රශ්නයට වන අතර ඊළඟට පහසුතාව වැඩි ප්‍රශ්න වනුයේ පිළිවෙළින් අංක 20 හා අංක 11 වේ. මෙම ප්‍රශ්න තුනෙහි පහසුතා පිළිවෙළින් 67%, 62% හා 60% වේ. ව්‍යාකරණ තේමාව යටතේ ඇති ප්‍රශ්න 15 අතුරෙන් පහසුතාව 60% හෝ ඊට ඉහළ අගයක් ලබා ඇත්තේ මෙම ප්‍රශ්න තුන පමණි. එමෙන්ම මෙම තේමාව යටතේ ඇති දුෂ්කරම ප්‍රශ්න වනුයේ අංක 08, 24 හා 29 ප්‍රශ්න වේ. ඒවායේ පහසුතා පිළිවෙළින් 12%, 25% හා 26% වේ. මෙම ප්‍රශ්න තුනෙහිම පහසුතා 30%ට වඩා අඩුවන අතර, අංක 8 ප්‍රශ්නය මෙම I පත්‍රයෙහි ඇති දුෂ්කරම ප්‍රශ්නය වෙයි. ව්‍යාකරණ තේමාවෙහි සමස්ත පහසුතාව 44%ක් වේ.

ව්‍යාකරණ තේමාව යටතේ ඇති 8 වන ප්‍රශ්නය, මෙම සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයෙහි ඇති මුළු ප්‍රශ්න 40 අතුරෙන් දුෂ්කරම වී ඇති ප්‍රශ්නයයි. එහි පහසුතාව 12% යනුවෙන් අදහස් වන්නේ මෙම ප්‍රශ්නයට නිවැරදි ව පිළිතුරු සැපයීමට හැකි වී ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 12%කට පමණක් බවයි. මෙම ප්‍රශ්නයට පාදක වී ඇත්තේ "රුසියානු" යන වචනයේ යෙදී ඇති පිල්ලම් හඳුනාගැනීමයි. අපේක්ෂකයින්ගෙන් 12%ක් මෙහි ඇති පිල්ලම් හතර නිවැරදි ව හඳුනාගනිද්දී අපේක්ෂකයින්ගෙන් 70%ක්ම තෝරාගෙන ඇත්තේ "රු" යන්නෙහි යෙදී ඇති පිල්ලම ඇදපිල්ල ලෙස සඳහන් වන තෙවන වරණයයි. පිල්ලම් පිළිබඳ ව ඉගෙන ගත යුත්තේ ප්‍රාථමික පන්ති මට්ටමේදී වුවත් එවැනි මූලික කරුණු පිළිබඳ දැනුම අ.පො.ස. සාමාන්‍ය පෙළ මට්ටම තෙක්ම පවත්වා ගැනීම අවශ්‍ය කරුණකි. අංක 24 ප්‍රශ්නය සඳහා ද නිවැරදි පිළිතුර අයත් දෙවන වරණය අපේක්ෂකයින්ගෙන් 25%ක් පමණක් තෝරද්දී ඔවුන්ගෙන් 48%ක්ම වික්ෂේපයක් වන හතරවන වරණය තෝරා ඇත. අන්තර්ජාතික යන පදයෙහි "අන්තර්" යනු විශේෂණයක් නොවන බව හඳුනා ගැනීමට මෙම 48%ට අයත් අපේක්ෂකයින් සියලු දෙනාම අපොහොසත් වී ඇත. අංක 29 ප්‍රශ්නය යටතේ දී ඇති සරල, කෙටි වාක්‍ය හතර අතුරෙන් ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරාගැනීමට සමත් වී ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 26%ක් පමණකි. අපේක්ෂකයින්ගෙන් 56%ක්ම මෙම ප්‍රශ්නයෙහි වික්ෂේපයක් වන පළමුවන වරණය තෝරා ඇති අතර, "මම පුරවැසියකු වන්නෙමි" යන්න සදොස් බව හෝ එය "මම පුරවැසියෙක් වන්නෙමි" යනුවෙන් නිවැරදි විය යුතු බව හෝ මෙම ශිෂ්‍ය පිරිස නොදන්නා බව ඉන් පැහැදිලි වේ. නොදැනුම්වත් බව හෝ නොසැලකිලිමත් බව හෝ නිසා බොහෝ ලේඛකයන් මෙන්ම බොහෝ ගුරුවරුන් ද ව්‍යාකරණානුකූල ව සදොස් වූ වැකි බහුලව භාවිත කරනු පෙනේ. ඒවා අසන දකින සිසුන් ද එම යෙදුම් නිවැරදි ලෙස සැලකීම නිසා හෝ ඒවායේ සදොස් බව හඳුනාගැනීමට අපොහොසත් වීම නිසා හෝ මෙලෙස මංමුළාවීම නොවැළැක්විය හැකිය. උසස් දැනුමට පාදක වන වියත් හා නිවැරදි භාෂා භාවිතය කෙරෙහි සිසුන් යොමු කරනු ලැබීම ජාතික අවශ්‍යතාවකි.

භාෂා සාහිත්‍යය

සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයෙහි භාෂා සාහිත්‍යය තේමාව ඇසුරින් සකස් වී ඇත්තේ අංක 23 ප්‍රශ්නය පමණක් වන අතර එහි පහසුතාව 27%කට සීමා වී තිබේ. එනම් එම ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර අයත් (4) වන වරණය තෝරා ඇත්තේ අයදුම්කරුවන්ගෙන් 27%ක් පමණකි. අයදුම්කරුවන්ගෙන් 42%ක් ම වැරදි වරණයක් වන (3) වන වරණය තෝරා ඇත. මෙහිදී නිවැරදි පිළිතුර වන "උපමා" යන්න වෙනුවට වැරදි පිළිතුරක් වන "රූපක" යන්න අයදුම්කරුවන්ගෙන් වැඩි ප්‍රතිශතයක් විසින් තෝරනු ලැබීමෙන් පෙනී යන්නේ උපමා හා රූපක පිළිබඳ ව වැඩි දෙනකුගේ දැනුම හා අවබෝධය නිරවුල් නොවන බවයි. වැඩි අවධානයක් යොමු විය යුතු ස්ථානයක් ලෙස මෙය කැපී පෙනෙයි. මෙම තේමාව යටතේ ඇත්තේ එක් ප්‍රශ්නයක් පමණක් වන අතර ඒ සඳහා මෙම I පත්‍රයෙන් වෙන් වී ඇත්තේ මුළු ලකුණුවලින් 2.5%ක් පමණි.

විශ්ලේෂණය හා අවබෝධය

සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයෙහි විශ්ලේෂණය හා අවබෝධය තේමාව යටතේ අංක 33 සිට 40 තෙක් ප්‍රශ්න 8ක් අඩංගු වෙයි. I පත්‍රයට හිමි මුළු ලකුණුවලින් 20%ක් මෙම තේමාව සඳහා වෙන් වෙයි. මෙම තේමාව යටතේ ඇති ප්‍රශ්න අට අතුරෙන් වැඩිම පහසුතාව ඇත්තේ අංක 39 ප්‍රශ්නයට වන අතර, එහි පහසුතාව 61% වේ. එම ප්‍රශ්න අට අතුරෙන් පහසුතාව 60% ඉක්මවා ඇත්තේ ද එම ප්‍රශ්නය පමණි. මෙම තේමාව යටතේ ඇති ප්‍රශ්න අතුරින් දුෂ්කරම ප්‍රශ්න වනුයේ අංක 40, 37 හා 38 වන අතර ඒවායේ පහසුතා පිළිවෙළින් 20%, 28% හා 31% වෙයි. මෙම ප්‍රශ්න සියල්ලෙහිම පහසුතා සලකා ගණනය කරනු ලැබූ විට තේමාවෙහි සමස්ත පහසුතාව 40%ක් වෙයි.

“විශ්ලේෂණය හා අවබෝධය” තේමාව යටතේ ඇති ප්‍රශ්න අතුරෙන් අංක 40 ප්‍රශ්නයට නිවැරදි ව පිළිතුරු සැපයීමට හැකිවී ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 20%කට පමණි. සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයය සඳහා නිර්දේශිත සාහිත්‍ය ග්‍රන්ථ පරිශීලනයේදී හමුවන දේශීය සංස්කෘතියට අදාළ යෙදුම් ඇසුරෙන් මෙම ප්‍රශ්නයට නිවැරදි පිළිතුර අයත් පළමුවන වරණය තෝරා ගත යුතුව තිබුණ ද, වැරදි පිළිතුරු අඩංගු වූ තෙවැනි වරණය අපේක්ෂකයින්ගෙන් 25%ක්ද, සිව්වැනි වරණය අපේක්ෂකයින්ගෙන් 51%ක්ද තෝරා තිබුණි. විභාගයේදී ලකුණු ලැබීමට පමණක් නොව සාහිත්‍යය රසවිඳීම අරමුණු කරගෙන පවා අඩු තරමින් නිර්දිෂ්ට සාහිත්‍ය ග්‍රන්ථ සීමිත සංඛ්‍යාවවත් අභිරුචියෙන් හා අවධානයෙන් පරිශීලනය කිරීම කෙරෙහි සිසුන් යොමු කරවනු ලැබිය යුතුය.

එක් ප්‍රශ්නයකට පමණක් පාදක වූ භාෂා සාහිත්‍යය තේමාව හැරුණු විට අනෙක් තේමා හතරෙහි පහසුතා 40% හෝ ඊට වැඩි අගයක් ලබා තිබීම තරමක් සතුටුදායක ලෙස පෙනෙන කරුණක් වුවද, ඒ එක් තේමාවකවත් පහසුතාව 60% ඉක්මවා නොතිබීම ගුරු සිසු දෙපක්ෂයේ පමණක් නොව ද්විතීයික අධ්‍යාපනය කෙරෙහි සැලකිල්ලක් දක්වන සැමගේත් දැඩි අවධානයට යොමු විය යුතු කරුණකි. සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයෙන් මනිනු ලබන්නේ විෂය නිර්දේශයෙහි දක්වා ඇති පරිදි භාෂාව ආශ්‍රිත මූලික කුසලතා හතර පමණකි. යථෝක්ත කුසලතා සියල්ල මනාව සපුරා ගැනීමෙන් තොරව මෙම විෂයයෙහි II හා III ප්‍රශ්න පත්‍රවලින් ඉහළ ලකුණු ලබාගැනීමට සිසුනට හැකිවේ යැයි පිළිගැනීම උගහට ය.

තවද මෙම සිංහල භාෂාව හා සාහිත්‍යය I පත්‍රයෙහි සමස්ත පහසුතාව 48%කට සීමා වී තිබීම ද අවධාරණය කළ යුතු කරුණකි. මූලික කරුණු පදනම් කරගත් මෙම I පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයින් ලබාගෙන ඇති ලකුණුවල මධ්‍යන්‍යය, ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණුවලින් 48%ක් පමණක් වීම, එනම් හරි අඩකටත් වඩා අඩුවීම, නැවත නැවතත් විමසිල්ලට ලක් කළ යුතු කරුණකි. ස්වභාෂාව ආශ්‍රිත මූලික භාෂා කුසලතා පිළිබඳව මෙවැනි සීමිත පහසුතාවක් පැවතීම අනෙකුත් විෂය ආශ්‍රිත සාධනය කෙරෙහි ද ප්‍රතිඝෝතාත්මක ලෙස බලපානු ලබන බැවින් මෙම තත්ත්වය මගහරවා ගැනීම සඳහා අනුගමනය කළ යුතු කාර්යක්ෂම ප්‍රතිකාර්ය කටයුතු කෙරෙහි පාසල් ප්‍රජාවගේ කඩිනම් අවධානය යොමු විය යුතුය.

2.2 II ප්‍රශ්න පත්‍රය

2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

1. ප්‍රශ්නය : භාෂා පරිචය ඇගයීම සඳහා සකස් කරන ලද කෙටි පිළිතුරු සැපයීමේ අනුප්‍රශ්න 10කින් සමන්විත වේ.
එක් අනුප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 20 කි.

2. ප්‍රශ්නය : නිර්දිෂ්ට ව්‍යූහගත තේමා හතරක් අතුරින් එකක් තෝරාගෙන දෙන ලද වචන සීමාවක් යටතේ රචනයක් ලිවිය යුතු වේ. තෝරා ගනු ලැබූ රචනා ව්‍යූහයට වඩාත් අදාළ වන සාරවත් කරුණු හඳුනාගෙන නිර්මාණාත්මක ලෙස සංවිධානය කර ඉදිරිපත් කිරීමේ හැකියාව මැනීම අපේක්ෂා කෙරේ.
ලකුණු 25 කි.

3. ප්‍රශ්නය : දෙන ලද පාඨයක සාරාංශය, දෙන ලද වචන සීමාවක් තුළ ලිවිය යුතු වේ. භාෂාමය සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව මැන බැලීම අපේක්ෂා කෙරේ.
ලකුණු 10 කි.

4. ප්‍රශ්නය : දෙන ලද ඡේදයක් ඇසුරෙන් විමසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සැපයිය යුතු වේ. අවබෝධය මැනීම අපේක්ෂා කෙරේ.
ලකුණු 10 කි.

5. ප්‍රශ්නය : දී ඇති අවශ්‍යතාවලට ගැළපෙන සේ අදළ ඉල්ලීමක් අඩංගු ලිපියක් හෝ අදළ තොරතුරු අඩංගු අත් පත්‍රිකාවක් හෝ ලිවිය යුතු වේ. ප්‍රායෝගික ලේඛන කුසලතා මැනීම අපේක්ෂා කෙරේ.
ලකුණු 15 කි.

II පත්‍රය සඳහා මුළු ලකුණු = 80

2.2.2 II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන

II පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ අංක 2, 3 හා 4 ප්‍රස්තාර ඇසුරෙන් ඉදිරිපත් කර ඇත. එක් එක් ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමඟ දක්වා ඇත.



(RD/16/04/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

සිංහල භාෂාව හා සාහිත්‍යය II පත්‍රයෙහි ඇති ප්‍රශ්න පහටම පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. එහෙත් අයදුම්කරුවන්ගෙන් වැඩිම ප්‍රතිශතයක් පිළිතුරු සපයා තිබුණේ පළමුවන ප්‍රශ්නයට වන අතර අඩුම ප්‍රතිශතයක් පිළිතුරු සපයා තිබුණේ 5 වන ප්‍රශ්නයට ය. එම ප්‍රතිශත පිළිවෙළින් 98% හා 91% (ප්‍රස්තාරය 2, පිටුව 9) වේ. අයදුම්කරුවන්ගෙන් වැඩිම ප්‍රතිශතයක් පළමුවන ප්‍රශ්නයට පිළිතුරු සපයා තිබූ නමුත් වැඩිම පහසුතාවක් ඇත්තේ 4 වන ප්‍රශ්නයට ය. එම ප්‍රශ්නය, දී ඇති ඡේදයක් පදනම් කරගෙන අසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට සැලැස්වීම මගින් සිසුන්ගේ අවබෝධය පිළිබඳ හැකියාව මැනීමේ අරමුණින් සකස් කරන ලද්දකි. එහි පහසුතාව 74%ක් පමණ වීම මගින් නිගමනය කළ හැක්කේ එම ප්‍රශ්නයට වඩාත් පහසුවෙන් හා සතුටුදායක ලෙස පිළිතුරු සැපයීමේ හැකියාව සිසුන් සතු වූ බවයි.

එසේම මෙම පත්‍රයේ ප්‍රශ්න පහ අතුරෙන් 2 වන ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගෙන් 96%කට ආසන්න ප්‍රතිශතයක් පිළිතුරු සපයා තිබූ නමුදු එම ප්‍රශ්නයෙහි පහසුතාව 47.3%කට සීමාවී තිබිණි. දී තිබූ රචනා ව්‍යූහ හතරෙන් එකක් ආශ්‍රයෙන් පමණක් රචනාවක් නිර්මාණය කිරීම සඳහා යොමු කෙරුණු මෙම ප්‍රශ්නය තුළ තම අභිමතය අනුව රචනා ව්‍යූහයක් තෝරා ගැනීමේ අවස්ථාවක් ද සිසුනට හිමිව තිබිණි. එසේම පූර්ව සූදානම මගින් වඩාත් සාර්ථක පිළිතුරක් නිර්මාණය කිරීමේ ඉඩ ප්‍රස්තා ද පැවතිණි. මෙම විෂයය යටතේ ප්‍රශ්න පත්‍ර තුනෙහි ම අඩංගු වන සියලු ම ප්‍රශ්න අතුරෙන් වැඩිම ලකුණු ප්‍රමාණයක් වෙන් කෙරෙන ප්‍රශ්නය ද මෙයයි. මෙවැනි වාසිදායක තත්ත්ව රැසක්ම තිබියදීත් සිසුන් විසින් මෙම ප්‍රශ්නය සඳහා සාපේක්ෂ වශයෙන් අඩුවෙන් ලකුණු ලබා තිබීම විශේෂ අවධානයට යොමු විය යුතු වේ.

01. ප්‍රශ්නය

අපේක්ෂණය : භාෂා පරිචය ඇගයීම
ව්‍යූහය : මෙම ප්‍රශ්නයට කෙටි පිළිතුරු අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ.

(i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ** නම් එහි **අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න**

1. (i) සිංහල අක්ෂර මාලාවෙහි ඇතුළත් වන ඌෂ්මාක්ෂර **දෙක** ද ඕෂ්ඨ්‍යාක්ෂර **දෙක** ද ලියා දක්වන්න.

(ii) පහත සඳහන් වාක්‍යයෙහි වචන දෙකක අක්ෂර විත්‍යාසය සදෙස් ය. එම වචන දෙක පමණක් නිදෙස් කර ලියන්න.
ප්‍රසිද්ධ ගායක-ගායිකාවන් රැසක් සහභාගි වූ සංගීත සංදර්ශනය කලට වෙලාවට ආරම්භ නොවූ හෙයින් නිම කිරීමට සිදුවූයේ අඵයම් පහට පමණ ය.

(iii) පහත සඳහන් පද **දෙක** විසන්ධි කොට ලියන්න.
(අ) අත්තම් (ආ) කවින්ද්‍ර

(iv) පහත සඳහන් පද **දෙක** කවර සමාසවලට අයත් දැයි නම් කරන්න.
(අ) අඹුදරු (ආ) මදපවන්

(v) (අ) 'ශිල්ප' යන පදයට 'ඊය' ප්‍රත්‍යය එකතු කිරීමෙන් 'ශිල්පීය, යන තද්ධිත පදය සෑදෙන්නාක් මෙන්, 'රූප' යන පදයට 'ඊය' ප්‍රත්‍යය එකතු කිරීමෙන් සෑදෙන තද්ධිත පදය කුමක් ද?
(ආ) 'පිය' යන පදයට 'ආණ,' ප්‍රත්‍යය එකතු කිරීමෙන් 'පියාණ' යන තද්ධිත පදය සෑදෙන්නාක් මෙන් 'නිවිදු' යන පදයට 'ආණ' ප්‍රත්‍යය එකතු කිරීමෙන් සෑදෙන තද්ධිත පදය කුමක්ද?

(vi) පහත සඳහන් වාක්‍ය දෙකෙහි තදකළු අකුරෙන් දක්වෙන පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.
(අ) වැව **පිරුණොත්** කෙත් වතු සරු වේවි.
(ආ) අම්මා බෙහෙත් **බී** නින්දට ගියා ය.

(vii) පහත සඳහන් පද **දෙකෙහි** විරුද්ධාර්ථ රූප ලියන්න.
(අ) උත්තම (ආ) ශීඝ්‍රගාමී

(viii) පහත සඳහන් කර්තෘකාරක වාක්‍ය දෙක කර්මකාරකයට හරවා ලියන්න.
(අ) ශිෂ්‍ය නායකයෝ නව විදුහල්පතිනිය පිළිගනිති.
(ආ) ගුරුළුගෝමිහු අමාවතුර රචනා කළහ.

(ix) පහත සඳහන් වචන **දෙකෙහි** අනුක්ත රූප ලියන්න.
(අ) විද්වත්හු (ආ) මැණියෝ

(x) පහත සඳහන් කවි පේළි දෙකෙහි ඇති තදකළු අකුරෙන් දක්වෙන පද වර්ගය නම් කරන්න.
(අ) මිදුලේ පහන් පැලේ නිතර **සැලුණු** දල්ල නිවී ගොස් ය.
(ආ) සියග මඟිය එනු කොයි **සිව** දද සමනල ගොසිනා

(ලකුණු 20 යි)

අපේක්ෂිත පිළිතුර

1. i. ඌෂ්මාක්ෂර - ශ, ෂ, ස, හ, ෆ
ඕෂ්ඨ්‍යාක්ෂර - ප, ඵ, බ, භ, ම, ඹ, උ, ඌ

ii. සංදර්ශනය, අලුයම (වාක්‍යයම නිවැරදි ව ලියා තිබුණ ද පිළිගත හැකිය.)

iii. අ. අත් + කම් ආ. කවි + ඉන්ද්‍ර

iv. අ. දකාරාර්ථ/ ද අරුත්
ආ. විශේෂණ/ වෙසෙසුන් වෙසෙස්/ වෙසෙසුන් සමස්/ විශේෂණ පූර්ව පද සමාස

v. අ. රූපීය ආ. කිවිදාණ

vi. අ. අසම්භාව්‍ය ක්‍රියා/ අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා/ අසබහව් කිරිය/ ආවස්ථික කෘදන්ත/ නේපාතික ක්‍රියා/ ක්‍රියා නිපාත/ නිපාත ක්‍රියා

viii. අ. ශිෂ්‍ය නායකයන්/ නායකයින් විසින් නව විදුහල්පතිනිය පිළිගැනේ/ පිළිගනු ලබයි/ පිළිගනු ලබන්නීය/ පිළිගැනෙන්නීය.
ආ. ගුරුළුගෝමීන් විසින් අමාවතුර රචනා කරන ලදි/ කෙරිණි/ කරනු ලැබීය/ කරනු ලැබිණි/ කරනු ලැබී/ කරන ලද්දේය/ කරනු ලැබුවේය.

ix. අ. විද්වතුන් ආ. මෑණියන්

x. අ. (අතීත) කෘදන්ත/ ක්‍රියා නාම/ ප්‍රත්‍යයාර්ථ නාම/ පසරුත් නම්/ කිතක නාම/ කර්මකාරක කෘදන්ත ක්‍රියා
ආ. නිපාත

1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන



මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වුවත් ඊට පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 98%ක පිරිසකි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.
ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 27%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 31%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 25%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 17%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 17%ක් වන අතර, 27%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙනි.



සිංහල භාෂාව හා සාහිත්‍යය II ප්‍රශ්න පත්‍රයෙහි පළමුවන ප්‍රශ්නය කොටස් 10ක් යටතේ අනුකොටස් 18කින් සමන්විත වේ. එම කොටස්/අනුකොටස් අතුරෙන් වැඩිම පහසුතාව ඇත්තේ (v) (අ) අනුකොටසට වන අතර එහි පහසුතාව 89%කි. ඊළඟට වැඩිම පහසුතා ඇත්තේ (ix) කොටසෙහි (අ) හා (ආ) අනුකොටස්වල වන අතර ඒවායේ පහසුතා පිළිවෙළින් 77% හා 78% වේ.

මෙම ප්‍රශ්නයෙහි අනුකොටස් අතුරෙන් වඩාත්ම දුෂ්කර අනුකොටස් වී ඇත්තේ (viii) (අ) හා (x) (අ) වන අතර ඒවායේ පහසුතා පිළිවෙළින් 26% හා 28% වේ.

ප්‍රශ්නයට අයත් කොටස්/අනුකොටස් 18 අතුරෙන් පහසුතාව 60% ඉක්මවා ඇත්තේ (iii) (අ), (v) (අ), (v) (ආ), (ix) (අ) හා (ix) (ආ) යන අනුකොටස් 5හි පමණි. එම අනුකොටස් පහ අතුරෙන් (v) (අ) සහ (v) (ආ) අනුකොටස්වලට පිළිතුරු සැපයිය යුතුව තිබුණේ, දී ඇති නිදසුන් අනුගමනය කරමින් බැවින්, ඒවා වඩාත් පහසුවී ඇත.

තවද පහසුතාව 40%ට වඩා අඩු අනුකොටස් පහක් ද මෙම ප්‍රශ්නයෙහි අන්තර්ගත වේ. ඒවා නම්, (iv) (අ), (vii) (අ), (viii) (අ), (viii) (ආ) සහ (x) (අ) වේ.

මෙම තොරතුරු අනුව උක්ත රූපයෙන් දී ඇති නාම පදවල අනුක්ත රූප ලිවීම සිසුනට පහසුවී ඇතත්, දී ඇති කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයට හැරවීම ඔවුනට දුෂ්කර වී ඇති බව පෙනේ. සිසුනට තම දැනුම නිවැරදි ව භාවිත කිරීමේ කුසලතාව හා පළපුරුද්ද ප්‍රමාණවත් මට්ටමින් නොමැති බව මින් ගම්‍ය වේ.

තවද සිංහල භාෂාවෙහි ප්‍රධාන ව්‍යාකරණ අංග වන "සමාස" හා "කෘදන්ත නාම" වැනි පද වර්ගීකරණ පිළිබඳව සිසුන්ගේ දැනුම අල්ප බව ද කැපී පෙනේ.

02 ප්‍රශ්නය

අපේක්ෂණය : සිසුන් සතු නිර්මාණාත්මක හැකියාව, ලේඛන කුසලතාව, කරුණු විශ්ලේෂණය කිරීමේ හා සංශ්ලේෂණය කිරීමේ හැකියාව සහ තමන් දන්නා තොරතුරු අතුරෙන් අදාළ කරුණු පමණක් තෝරා වෙන් කර ගෙන ඒවා සංවිධානාත්මකව ඉදිරිපත් කිරීමේ හැකියාව මැන බැලීම මෙහිදී අපේක්ෂා කෙරේ. දෙන ලද කෙටි හැඳින්වීම පදනම් කොට ගෙන නිර්දිෂ්ට වචන සංඛ්‍යාවට නොඅඩු වන සේ නිර්මාණාත්මක රචනාවක් ලිවීම මෙහිදී අවශ්‍ය වේ. තමා ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන කරුණු විශ්ලේෂණය කරගෙන ඒවා ඉදිරිපත් කළ යුතු ව්‍යූහය තීරණය කර, ඒ අනුව යෝග්‍ය පරිදි ඡේදවලට හා අනුඡේදවලට බෙදා රචනාව නිර්මාණය කිරීමෙන් දීර්ඝ විස්තර සංශ්ලේෂණය කිරීමේ හැකියාව ද මෙහිදී ඇගයීමට ලක් කෙරේ. එබැවින් රචනාවෙහි අදහස් ඉදිරිපත් කිරීමේ ස්වභාවය විශ්ලේෂණාත්මක මෙන්ම සංශ්ලේෂණාත්මක ද විය යුතු වේ. රචනයේ ආරම්භය, මධ්‍යය හා අවසානය අතර මනා ගැළපීමක් තිබීම ද අවශ්‍ය ය. අපේක්ෂකයන්ගේ භාෂා භාවිතය පිළිබඳ ව පවත්නා හැකියාව ද මෙහිදී සොයා බැලෙන බැවින් නිවැරදි අක්ෂර වින්‍යාසය, නිවැරදි හා ව්‍යක්ත පද භාවිතය, ව්‍යාකරණානුකූල සරල වාක්‍ය භාවිතය යනාදි කරුණු කෙරෙහි ද මෙහිදී අවධානය යොමු කෙරේ.

2. පහත දක්වෙන **අ. ආ. ඉ. ඊ** යන විස්තර අතුරෙන් **එකක්** තෝරාගෙන **වචන 250 කට නොඅඩු** වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) ඕනෑ ම රටක ජීවත් වන මිනිසුන්ගේ චින්තනය, නිර්මාණශීලිත්වය හා කලාරසඥතාව පිළිබිඹු වන්නේ එරටට අයත් සාහිත්‍ය කෘති මඟිනි. එහෙත් වර්තමානයේ ඉතා වේගයෙන් ව්‍යාප්ත වන රූපවාහිනිය, අන්තර්ජාලය වැනි විද්‍යුත් මාධ්‍ය නිසා මෙරට ළමයින් මෙන් ම වැඩිහිටියන් ද සාහිත්‍ය කෘති පරිශීලනයෙන් බැහැර වනු දකිය හැකි ය. මෙහි අවසන් ප්‍රතිඵලය එතරම් සුබදායී එකක් නොවනු ඇත.

(ආ) ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය ක්‍රමයට දීර්ඝ ඉතිහාසයක් තිබේ. ඒ බව විවිධ පුරාවෘත්තවලිනුත් ඓතිහාසික මූලාශ්‍රයවලිනුත් තහවුරු කරගත හැකි ය. දේශීය ප්‍රතිකාර විධි හා ඖෂධ වර්ග ආශ්‍රයෙන් සිදු කෙරෙන මේ වෛද්‍ය ප්‍රතිකාර ක්‍රමය පිළිබඳ මිනිසුන් දනුවත් කොට, එය ව්‍යාප්ත කිරීමට සැලසුම් සකස් කිරීම කාලීන අවශ්‍යතාවකි.

(ඉ) ශ්‍රී ලංකාවේ සිදුවන රිය අනතුරු ප්‍රමාණය දිනෙන් දින ම ඉහළ යමින් පවතී. මහා මාර්ග පද්ධතියේ අඩුපාඩු මෙන් ම රියැදුරන්ගේ සහ පදිකයන්ගේ නොසැලකිලිමත් බව රිය අනතුරු බහුලවීමට බලපාන ප්‍රධාන හේතුපාටක වශයෙන් හඳුනාගෙන තිබේ. දඩි නිතිරීති මෙන් ම රියැදුරන්ගේ හා පදිකයන්ගේ කැපවීම ද රිය අනතුරු වළක්වා ගැනීම සඳහා බෙහෙවින් ම වැදගත් වේ.

(ඒ) මිනිසුන්ට මෙන් ම සතුන්ට ද මිහිපිට ජීවත් වීමට ඇත්තේ එකසමාන අයිතියකි. මස් - මාංශ අනුභවය පිණිස මිනිසුන් විසින් සත්තු ඝාතනය කෙරෙහි, එසේ ම සුරතලුන් වශයෙන් සතුන් කුඩුවල හෝ වෙනත් ස්ථානවල හෝ සිර කොට තැබීමෙන් පීඩාවට ලක්කෙරේ. මේ සත්ත්ව හිංසනය පිටුදැකීම කෙරෙහි කාගේත් අවධානය යොමු විය යුතු ය. එමගින් සතුන්ට නිදහසේ ජීවත්වීමට ඇති අයිතිය තහවුරු වෙනවා මෙන් ම පරිසරයේ ජෛව විවිධත්වය ද සුරක්ෂිත වේ.

(ලකුණු 25 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

එක් එක් විස්තරයට අදාළ වන්නේ පහත සඳහන් ප්‍රධාන අදහස් ය.

(අ) සාහිත්‍ය රුචිය නංවමු.
(ආ) දේශීය වෛද්‍ය ක්‍රමයේ පුනරුදය
(ඉ) රිය අනතුරු ඇයි නිරතුරු?
(ඒ) සත්ත්ව හිංසනය පිටු දකිමු.

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25 යි

1. සාරවත් භාවය, මාතෘකාව ද ඇතුළු ව - ලකුණු 08 යි
2. සංවිධානය, නිර්මාණාත්මක භාවය හා ස්වීයත්වය - ලකුණු 12 යි
3. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05 යි

01. සාරවත්භාවය - ලකුණු 07 යි
විස්තරයට අදාළ වන පරිදි මාතෘකාවක් යොදා තිබීම - ලකුණු 01 යි

තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යූහයට සමීප බව, සරුබව හා සමබව, වචන ගණන 250ට සමීපව පැවැතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු වේ.

02. සංවිධානය, නිර්මාණාත්මක භාවය හා ස්වීයත්වය - ලකුණු 12 යි

මෙහිදී උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශන, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදි අංශ ගැන සලකා බැලිය යුතු ය.

03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05 යි

වියරණ, අත් අකුරු, විරාම ලක්ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම, පද වෙන් කොට ලිවීම යන අංශ ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතු වේ.

සැලකිය යුතුයි :

01. රචනයේ වචන ගණන දළ වශයෙන් 200ට වඩා අඩු වන කල්හි ඉහත දැක්වූ 1, 2, 3 යන කොටස්වලට අනුපාතික ව ලකුණක් තීරණය කෙරේ.
02. වැදගත් අදහස් හා සිත් ගන්නා ප්‍රකාශන, වැඩි ලකුණු ලැබීමට හේතු වේ.
03. උක්තාඛ්‍යාත සම්බන්ධ දෝෂ හා අක්ෂර වින්‍යාස දෝෂ ලකුණු අඩුවීමට හේතු වේ.
04. දී ඇති ව්‍යූහයට අදාළ නොවන සේ ලියා ඇති රචනා ඇගයීමේදී සාරවත්භාවය සඳහා පිරිනමනු ලබන්නේ ඉතා අඩු ලකුණකි.

2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන



2 ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇති පිරිස අපේක්ෂකයන්ගෙන් 96%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 25ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 06 ප්‍රාන්තරයේ 6%ක් ද,
ලකුණු 07 - 12 ප්‍රාන්තරයේ 19%ක් ද,
ලකුණු 13 - 18 ප්‍රාන්තරයේ 50%ක් ද,
ලකුණු 19 - 25 ප්‍රාන්තරයේ 25%ක් ද,

ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 19ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 25%ක් වන අතර, 6%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 6ක් හෝ ඊට අඩුවෙනි.

සමස්ත ලෙස ගත් කල රචනා ප්‍රශ්නයට ලකුණු ලබා ගැනීම සාර්ථක මට්ටමක පැවතුණි. ප්‍රශ්නයට හිමි මුළු ලකුණු ප්‍රමාණයෙන් හරි අඩකට වඩා වැඩියෙන් ලබා තිබූ අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 75%කි. ලකුණු 12ට අඩුවෙන් ලබා තිබුණේ අපේක්ෂකයන්ගෙන් 25%කි. ඉන් 6%ක් ඉතා අඩු මට්ටමක පැවතුණි. ලකුණු මට්ටම් තවදුරටත් වර්ධනය කිරීම සඳහා බාහිර පොත් පත් කියවීමටත් නිරන්තරයෙන් රචනා ලියවීමටත් සිසුන් උනන්දු කළ යුතු ය.



දෙවන ප්‍රශ්නය, දී ඇති රචනා ව්‍යූහ හතරකින් යුක්ත විය. එයින් එක් රචනා ව්‍යූහයක් පමණ තෝරා ගෙන රචනාව ලිවීම අපේක්ෂා කෙරිණි. එක් එක් රචනාවට ලකුණු ලබාගත් ආකාරය අනුව එම රචනා ව්‍යූහවල පහසුතා පිළිවෙළින් 52%, 26%, 55% හා 56% විය.

ඒ අතුරින් (අ), (ඉ) හා (ඊ) යන රචනා සඳහා වඩාත් සාර්ථක පිළිතුරු දක්නට ලැබිණ. (ආ) කොටස තෝරාගත් අපේක්ෂකයන්ගේ පිළිතුරු එතරම් සාර්ථක නොවූ බව පැහැදිලි විය. රචනා ලියවීමේදී විවිධ තේමා ඔස්සේ සිසුන් යොමු කිරීමට ගුරුභවතුන් උනන්දු විය යුතු ය.

සමස්තයක් වශයෙන් ගත් කල මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 47%කට ආසන්න අගයකට සීමා වී ඇත. ඒ අනුව II පත්‍රයෙහි ප්‍රශ්න පහ අතුරෙන් සිසුනට ඉහළ ලකුණු ලබාගැනීමට වඩාත් දුෂ්කර වූ ප්‍රශ්නය මෙය ලෙස සැලකිය හැකිය.

රචනා ලිවීමේ නිපුණතාව සිසුන් තුළ තව තවත් වර්ධනය කළ යුතුය. එමඟින්, නිර්මාණාත්මක අදහස් ජනනය කරවීමෙත්, ස්වකීය අදහස් විධිමත්ව හා සංවිධානාත්මකව ඉදිරිපත් කිරීමෙත් කුසලතාව වර්ධනය වීමත් වාං මාලාව පෝෂණය වීමත් සිදුවන බැවිනි. එහෙයින් සිසුන් ලවා නිරන්තරව රචනා ලියවිය යුතුය. අතිරේක පොත් පත් කියවීම, සාර්ථක රචනා ලිවීමට මහඟු අත්වැලක් බව සිසුන්ට අවධාරණය කළ යුතුය. දෙනු ලබන මාතෘකාවක් පිළිබඳ අදහස් තර්කානුකූලව, අර්ථවත්ව, නිර්මාණාත්මකව හා සංවිධානාත්මකව ඉදිරිපත් කළ හැකි අයුරුත් ශිල්පීය දක්ෂතා තුළින් ඒවා තවත් ක්‍රමානුකූල හා අර්ථවත් කළ හැකි අයුරුත් සිසුන්ට පෙන්වා දීම වැදගත් ය.

II පත්‍රයට වෙන් කර ඇති ලකුණු 80න් වැඩිම ලකුණු ප්‍රමාණයක් එනම් ලකුණු 25ක් ම හිමිවන්නේ අංක 2 ප්‍රශ්නය සඳහා වන පිළිතුරටයි. එනම් දෙන ලද විස්තරයට හෙවත් රචනා ව්‍යූහයට අනුව ලියනු ලබන රචනයටයි. සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයය යටතේ ඇති ප්‍රශ්න පත්‍ර තුනටම හිමි මුළු ලකුණුවලින් 12.5%ක ප්‍රතිශතයක් මෙම ප්‍රශ්නයට හිමිවන බැවින්, මනා සූදානමකින් යුතුව සාර්ථක රචනාවක් ලිවීම මඟින් වැඩි ලකුණු ප්‍රමාණයක් උපයා ගැනීමට සිසුන් පෙළඹවීම වඩාත් ඵලදායී වේ.

දී තිබූ ව්‍යූහ පාදක කරගෙන ලියන ලද රචනා හතර අතුරින් අඩුම මට්ටමින් ලකුණු ලබාගෙන ඇත්තේ (ආ) ව්‍යූහය පාදක කර ගන්නා ලද රචනයයි. එබැවින් සිසුනට මග පෙන්වීමක් ලෙස එම ව්‍යූහය පාදක කරගෙන **දේශීය වෛද්‍ය ක්‍රමයේ පුනරුදය** යන මාතෘකාව යටතේ ලියන ලද රචනයක්, ආදර්ශයක් ලෙස පහත දැක්වේ.

2. (ආ) ***දේශීය වෛද්‍ය ක්‍රමයේ පුනරුදය***

මෙලොව ජීවත් වන සෑම පුද්ගලයකුගේ ම මූලික අපේක්ෂාවක් වන්නේ නිරෝගිමත් ජීවිතයක් ගත කිරීමයි. එහෙත් සෑම අයෙක් ම ජීවිතයේ විවිධ අවස්ථාවල විවිධ රෝගාබාධවලට ගොදුරු වෙති. මේ නිසා අපේ පැරන්නන් සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් ගොඩනඟා ගැනීමට නොයෙක් ක්‍රමවේද අනුග මනය කර ඇත. දේශීය වෛද්‍ය ක්‍රමය බිහිවූයේ එහි ප්‍රතිඵලයක් ලෙසයි. අනාදිමත් කාලයක සිට ම අප රටේ වෙදකම ඉතා දියුණු මට්ටමක පැවති බවට තොරතුරු රැසක් හමු වෙයි.

ඉංග්‍රීසි ආධිපත්‍යයට නතු වීමට පෙර බොහෝ සෙයින් අප රටේ ජනතාව රෝග සඳහා ප්‍රතිකාර ලැබුවේ දේශීය වෛද්‍ය ක්‍රම මගිනි. සිංහල රජ දවස දේශීය වෙදකම රාජානුග්‍රහය ලැබූ ගෞරවනීය සේවාවක් විය. බුද්ධදාස වැනි රජවරුන් වෛද්‍ය වෘත්තියෙහි නියැළුණු බව ඉතිහාසයේ සඳහන් වෙයි. එතුමා මිනිසුන් සඳහා පමණක් නොව තිරිසන් සතුන්ට පවා ප්‍රතිකාර කළ බව ප්‍රකට ය. මහා පරාක්‍රමබාහු රජතුමා ද වෛද්‍ය ශාස්ත්‍රයට විශාල සේවාවක් කළ අයෙකි. දුටුගැමුණු රජතුමා ආරෝග්‍යශාලා ඉදිකිරීමත්, වෙදුන්ට වැටුප් ලබාදීම හා ගරු සත්කාර කිරීමත් කළ බව සද්ධර්මාලංකාරයෙහි සඳහන් වේ.

බටහිර වෛද්‍ය ක්‍රමයේ ව්‍යාප්තිය සමඟ දේශීය වෙදකම නොසලකා හරිනු ලැබීම නිසා එහි පිරිහීම ආරම්භ විය. 1958 දී ආයුර්වේද දෙපාර්තමේන්තුව හා දේශීය වෛද්‍ය පර්යේෂණ ආයතනය පිහිටුවීමත් සමඟ මෙම වෛද්‍ය ක්‍රමයේ පුනර්ජීවයක් ඇති විය. 1981 දී දේශීය වෛද්‍ය අමාත්‍යාංශය පිහිටුවීම ඉතා වැදගත් අවස්ථාවක් විය. දේශීය වෛද්‍ය ක්‍රමය පිළිබඳ ව මිනිසුන් දැනුවත් කිරීමටත්, එය ව්‍යාප්ත කිරීමටත් මෙම රාජ්‍ය ප්‍රතිපත්ති මහෝපකාරී විය.

අප රටේ විශාල පිරිසක් දේශීය වෙදකම කෙරෙහි නැඹුරුවක් දැක්වුවත් ඔවුන්ගේ අවශ්‍යතා අනුව වෛද්‍ය පහසුකම් ප්‍රමාණවත් නොවීම නිසා බටහිර වෙදකම වෙත යොමුවීම දක්නට ලැබේ. දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ව වත්මන් මිනිසුන්ගේ දැනුම්වත් වීම ප්‍රමාණවත් නොවේ. ස්වාභාවික ඖෂධ භාවිතයෙහි හිතකර ස්වභාවයත්, බටහිර ඖෂධ භාවිතයෙන් විය හැකි අනිටු ප්‍රතිඵල හා අතුරු ආබාධ පිළිබඳවත් ජනතාව දැනුම්වත් කළ යුතු ය. පාසල් මට්ටමින් දරුවන්ට දැනුම ලබා දීමත්, ජනමාධ්‍ය මගින් ජනතාවගේ දැනුම හා ආකල්ප ධනාත්මක ව සවිබල ගැන්වීමත් දේශීය වෛද්‍ය සේවාවේ ප්‍රගමනයට හේතු වනු ඇත.

දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ සේවාව තවදුරටත් පුළුල් සේවාවක් බවට පරිවර්තනය කළ යුතුය. වෘක්ෂ ලතාවලින් සපිරි ලක් පොළොවේ වනාන්තරවල ඖෂධ වර්ගවල හිඟයක් නොමැත. දේශීය ඖෂධ වර්ග ප්‍රමාණවත් ලෙස නිපදවීමටත්, ඒවා කල්තබා ගැනීමටත්, සුරක්ෂිත කර ගැනීමටත් තාක්ෂණය ප්‍රවලිත කළ යුතුය. දේශීය වෛද්‍යවරුන් බිහිකිරීම හා ආරෝග්‍යශාලා පිහිටුවීම තවදුරටත් ව්‍යාප්ත කළ යුතුය. සොබා දහමින් අපට ලැබුණු ඖෂධ නමැති උතුම් දායාදය අපේ සෞඛ්‍ය සම්පන්න ජීවිතයට දිව ඔසුවක් කර ගනිමු.

03 ප්‍රශ්නය

අපේක්ෂණය :

දී ඇති ඡේදයක් කියවා, එහි අඩංගු විස්තර වර්ණනා බැහැර කරමින්, ඡේදයෙහි හරය වටහා ගෙන, ඒ ඇසුරින් සමස්ත අර්ථය කැටි කොට තම වචනයෙන් ඉදිරිපත් කිරීමේ හැකියාව මෙහිදී ඇගයේ. එසේ ම සංශ්ලේෂණ මෙන් ම විශ්ලේෂණ හැකියාව ද ඇගයීමට භාජන කෙරේ.

3. පහත දක්වෙන ඡේදය වචන **50 - 60** අතර ගණනකින් යුක්ත වන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ වචන සංඛ්‍යාව උත්තරය අග ලියන්න.

18 සහ 19 වැනි ශතවර්ෂයන්හි සිදු වූ ඇතැම් සමාජ විපර්යාස සාහිත්‍යය කෙරෙහි බලපෑ බව ද එය අලුත් මුහුණුවරකින් සකස්කිරීමෙහි ලා උපකාරී වූ බව ද වර්තමාන සාහිත්‍යය දෙස විචාරාත්මකයෙන් බලන විට පෙනී යයි. යාන්ත්‍රික යුගයකට සවිලන පවිදි සමාජය හැඩ ගැසීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් එහි අලුත් පන්තියක් පැන නැඟේය- එනම් නාගරික මැද පන්තිය ය. වර්තමාන ලේඛකයන් බොහෝ සෙයින් බිහි වූයේ අලුතෙන් උද්ගත වූ මැද පන්තියෙන් ය. අතීතයෙහි සිට වැඩි වශයෙන් පැවිදි කතුවරුන්ට හෝ ව නිබූ ලේඛන කලාව ක්‍රමයෙන් ඔවුන්ගේ අතින් ගිලිහී ගිහි ලේඛකයන්ගේ අතට පැමිණෙන්නට පටන් ගනී. මේ වූ කලී සාහිත්‍ය ලෝකයෙහි එක්තරා විප්ලවයක් ඇති කිරීමෙහි ලා සමර්ථ වූ සිදුවීමකි. පැවිදි ලේඛකයන්ගේ කැසිවලට සාමාන්‍යයෙන් විෂය නොවූ ඇතැම් මාතෘකා ගිහි ලේඛකයෝ තම රචනාවලට වස්තු කොටගත්හ. බෙහෙවින් ආඛ්‍යික ස්වරූපයක් දරූ පැරණි සිංහල සාහිත්‍යය පොදු ජනයාගේ සාහිත්‍යයක් බවට පෙරළුණේ මේ සමාජ විපර්යාසයේ ප්‍රතිඵලයක් වශයෙනැයි කිව හැකි ය. කවියාගේ පෞද්ගලික හැඟීම් ගැබ් කොට රචනා කරන ලද ශෘංගාරාත්මක පද්‍ය විශේෂයක් සිංහලයෙහි පහළ වූයේ මේ සමාජ විපර්යාසයට අප සාහිත්‍යය ගොදුරු වූ ප්‍රථම අවස්ථාවෙහි ය. එනම් මාතර අවධියෙහි ය.

(ලකුණු 10 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

ලකුණු විග්‍රහය	-	මුළු ලකුණු 10 යි.
අන්තර්ගතය	-	ප්‍රධාන අදහස් සඳහා ලකුණු 05 යි.
වචන ගණන	-	ලකුණු 03 යි. (වචන 50 - 60 අතර තිබීම සෑහේ.)
ශිල්පීය දක්ෂතා	-	ලකුණු 02 යි. (වියරණ, අත් අකුරු, විරාම ලක්ෂණ ආදිය)

අපේක්ෂිත ප්‍රධාන අදහස් :

- 18, 19 සියවස්වල ඇති වූ සමාජ විපර්යාසය සාහිත්‍යයට ඇති කළ බලපෑම
- යාන්ත්‍රික යුගයකට අනුව සැකසුණු සමාජයේ ප්‍රතිඵලයක් ලෙස නාගරික මධ්‍යම පන්තියෙන් ලේඛකයින් බිහිවීම
- භික්ෂූන් භාරයේ පැවැති සාහිත්‍යය ගිහියන් අතට පත්වීම නිසා සාහිත්‍ය ලෝකයේ විප්ලවයක් ඇතිවීම
- ආගමික සාහිත්‍යය පොදු ජන සාහිත්‍යයක් බවට පරිවර්තනය වීම
- මාතර අවධියේ දී ශෘංගාරාත්මක පද්‍ය සිංහල සාහිත්‍යයට එක් වීම

වචන ගණන 65 ඉක්මවන කල්හි සලකනු ලබන්නේ මුල් වචන 60 තුළ ඇති ප්‍රධාන අදහස් පමණි. වචන ගණන 45ට අඩුවන කල්හි එහි ඇතුළත් අදහස් ගණනය කොට ඊට සුදුසු අනුපාතික ලකුණක් පිරිනැමේ. උත්තරය ඡේදයක් සේ ලියා තිබිය යුතු ය. කොටුවක් තුළ පද බෙදා තිබුණ ද පිළිගැනේ. එක යට එක අසම්බන්ධිත වාක්‍ය වශයෙන් ලියා ඇත්නම් අන්තර්ගතයට දිය හැකි උපරිම ලකුණු ගණන 02 කි. වචන ගණන දළ වශයෙන් 65ට වැඩිවන කල්හි හෝ 45ට අඩුවන කල්හි වචන ගණන සඳහා ලකුණු 01ක් හෝ 02ක් හෝ පමණක් පිරිනැමේ.

3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන



3 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 95%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමිවේ.
ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 4%ක් ද,
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 14%ක් ද,
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 33%ක් ද,
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 49%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 06ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 82%ක් වන අතර, 18%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙනි.

මෙම ප්‍රශ්නය සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනැමෙයි. ප්‍රශ්නයට හිමි මුළු ලකුණු ප්‍රමාණය 10කි. ඒ අනුව මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයූ අයදුම්කරුවන් ලැබූ ලකුණුවල මධ්‍යන්‍යය 7ක්, එනම් ප්‍රශ්නයට හිමි ලකුණුවලින් 70%ක් වේ.

සාරාංශය ලිවීමේ ප්‍රශ්නයට ලකුණු ලබාගෙන තිබූ ආකාරය සතුටුදායක විය. සාර්ථකව පිළිතුරු ලියා තිබූ, එනම් ප්‍රශ්නයට හිමි ලකුණුවලින් හරි අඩකට වඩා ලබා තිබූ සංඛ්‍යාව 79%ක් පමණ විය. එහෙත් 4%ක් ඉතා දුර්වල මට්ටමක පැවතිණ.

ඡේදයක් කියවා එහි ඇති වර්ණනා හා අතුරු අදහස් බැහැර කොට මූලික හරය පමණක් මතුකිරීමේ හැකියාව සිසුන් තුළ වර්ධනය කළ යුතුය. එමෙන්ම නිවැරදිව සාරාංශ ලිවීමේ ක්‍රම ශිල්පය ද සිසුන්ට හුරු කළ යුතුය.

අපේක්ෂිත සාරාංශය පිළිබඳව පැහැදිලි අදහසක් ලබාදීමේ අරමුණින් ලියන ලද **සාරාංශයක ආදර්ශයක්** පහත දැක්වේ.

18, 19 සියවස්වල ඇති වූ සමාජ විපර්යාසය වර්තමාන සාහිත්‍යයට බලපා තිබේ. යාන්ත්‍රික යුගයකට අනුව සැකසුණු සමාජයේ ප්‍රතිඵලයක් ලෙස නාගරික මධ්‍යම පන්තිය බිහි විය. භික්ෂූන් භාරයේ පැවති සාහිත්‍යය ගිහියන් අතට පත්වීම සාහිත්‍ය ලෝකයේ විප්ලවයට තුඩු දුනි. මෙතෙක් පැවති ආගමික සාහිත්‍යය පොදුජන සාහිත්‍යයක් බවට පරිවර්තනය වීමත් මාතර අවධියේ දී ගෘංගාරාත්මක පද්‍ය සිංහල සාහිත්‍යයට එක් වීමත් එහි ප්‍රතිඵලයකි.

04 ප්‍රශ්නය

අපේක්ෂණය : ඉදිරිපත් කොට ඇති ඡේදය ඇසුරින් අවබෝධය හැකියාව මැනීම

4. පහත දක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර සපයන්න.

ශාස්ත්‍රාධිගමය පිළිබඳ පැරණි පිළිවෙත අනුව ඇදුරු පා සෙවනෙහි විසා අන් මාර්ගයකින් ශාස්ත්‍රෝද්ග්‍රහණය කළ හැකි නො වී ය. එය ආචාර්ය ශිෂ්‍ය උභය පක්ෂය විසින් උත්කෘෂ්ට පරමාර්ථයෙන් වෙළී එක්වන් ව ඉටු කරන ලද උදර සේවයකි. ආචාර්යවරයා හා ශිෂ්‍යයා අතර පැවැත්තේ මවුපොවුන් විශයෙහි වූ දයාලු බවකින් පරිපූර්ණ වූ සම්බන්ධ කමකි. මේ නියායෙන් ශිෂ්‍යයා විසින් ආචාර්යවරයා කෙරෙහි පැවතිය යුතු වන් පිළිවෙත්, ඇප උපස්ථාන කොටසක් මෙන් ම ගුරුවරයා ශිෂ්‍යයා කෙරෙහි පෙරළා දක්විය යුතු ආචාර විධි පද්ධතියක් ද විය. ගුරුවරයා ස්වකීය පුත්‍ර ස්ථානයෙහි ලා ශිෂ්‍යයා සැලකූ අතර ශිෂ්‍යයා ද ඔහුට පියකුට සේ ආදර සංග්‍රහ පැවැත්විය. මේ පිළිවෙත අනුව ශිෂ්‍යයාගේ සුචරිත වර්ධනයෙහි ලා ගුරුවරයාගේ ගුණ සමුදය බෙහෙවින් ඉවහල් විය. ශිෂ්‍යයා විසින් ආචාර්යවරයා ඇප උපස්ථාන හා වත් පිළිවෙත් ආදියෙන් පුදන ලද්දේ උදක් සිය කැමැත්තෙනි. ගුරු පඬුරින් ආචාර්යවරයා පිදීම ද එවක පැවැති පිළිගත් චාරිත්‍ර ධර්මයක් වූයේ ය. ශාස්ත්‍රාධිගම කුසල සම්පන්න වූ ඡාත්‍රයාට තමා දන් සකල ශාස්ත්‍රය ම නොවළහා ඉඟැන්වීම ආචාර්යවරයාගේ පරම යුතුකම් විය. ශිෂ්‍යයා තමා අභිසවා යති යි සැකයෙන් ගුරුමුෂ්ටි වශයෙන් කිසියම් දනුම් විශේෂයක් සහවා ගැනීම ආචාර්යවරයකු අතින් සිදු විය හැකි වූ බරපතල වරදකි. මේ වරද නූතනයෙහි ද ඇතැම් විට විද්‍යමාන නොවන්නේ නො වේ. ශාස්ත්‍ර ඥානය ධනෝපායන මාර්ගයක් කර ගත් ගුරුවරයා සමාජය විසින් පිටු දක්නා ලදි. නිස්සරණාධ්‍යාශයෙන් ශාස්ත්‍ර දනයෙහි යෙදුණු මහඟු ආචාර්යවරයා සියල්ලන්ගේ ම ආදර ගෞරවයට පාත්‍ර විය.

(i) ආචාර්ය ශිෂ්‍ය උභය පක්ෂය විසින් උත්කෘෂ්ට පරමාර්ථයෙන් ඉටු කළ උදර සේවය කුමක් ද?
(ii) ශිෂ්‍යයාගේ සුචරිත වර්ධනයෙහි ලා බෙහෙවින් ම බලපාන්නේ කුමක් ද?
(iii) සමාජය විසින් පිටුදකිනු ලබන්නෝ කවර වර්ගයේ ගුරුවරු ද?
(iv) සියල්ලන්ගේ ම ආදර ගෞරවයට පාත්‍රවන්නෝ කවර වර්ගයේ ගුරුවරු ද ?
(v) මෙහි සඳහන් 'ශාස්ත්‍රෝද්ග්‍රහණය' හා 'ගුරුමුෂ්ටිය' යන වචනවල අර්ථ දක්වන්න.

(ලකුණු 10 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

4. (i) ශාස්ත්‍රෝද්ග්‍රහණය/(ශිල්ප ශාස්ත්‍ර) ඉගෙනීම/ ඉගෙන ගැනීම
ඇදුරු පා සෙවනෙහි පමණක් ශාස්ත්‍රෝද්ග්‍රහණය කිරීම
(ii) ගුරුවරයාගේ ගුණ සමුදාය
(iii) ශාස්ත්‍ර ඥානය ධනෝපායන මාර්ගයක් කරගත් ගුරුවරයකු
(iv) නිස්සරණාධ්‍යාශයෙන්/ ලාභාපේක්ෂාවකින් තොරව/ වස්තු අපේක්ෂාවකින් තොරව ශාස්ත්‍රදානයෙහි යෙදුණු ගුරුවරු
(v)
- ශාස්ත්‍රෝද්ග්‍රහණය - ශිල්ප ශාස්ත්‍ර ඉගෙනීම/ ශිල්ප ඉගෙන ගැනීම/ අධ්‍යාපනය ලැබීම
- ගුරු මුෂ්ටිය - ගුරුවරයා සඟවා ගත් දැනුම
(සමාන අදහස් නිවැරදි උත්තරය සේ පිළිගැනේ.)

(එක කොටසකට ලකුණු 02 බැගින් ලකුණු 10 යි.)

4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන



4 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 95%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 14%ක් ද,
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 21%ක් ද,
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 36%ක් ද,
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 29%ක් ද,

ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 06ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 65%ක් වන අතර, 14%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 02ක් හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් කොටස් 5 අතුරෙන් පහසුතාව වැඩිම කොටස (iv) වන අතර එහි පහසුතාව 87%කි. එසේ ම පහසුතාව අඩුම කොටස වන්නේ (v) වන අතර එහි පහසුතාව 57% කි.

මේ ප්‍රශ්නයට පිළිතුරු සැපයීම වඩාත් සාර්ථක මට්ටමක පැවති බව පෙනේ. අවබෝධය පිළිබඳ ව විමසා තිබූ ප්‍රශ්න 5න් මුල් ප්‍රශ්න 4හිම පහසුතා 70% ඉක්මවා තිබිණි. ඒ අනුව මෙම ප්‍රශ්නයෙහි සමස්ත පහසුතාව 74%ක පමණ ඉහළ අගයක් ගන්නා අතර II පත්‍රයෙහි ප්‍රශ්න පහ අතුරෙන් පහසුතාව වැඩිම ප්‍රශ්නය බවට මෙම ප්‍රශ්නය පත්ව තිබේ.

මේ තත්ත්වය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා බාහිර පොත් පත් පරිශීලනයට සිසුන් උනන්දු කරවීම ගුරුභවතුන්ගේ කාර්යයකි. එහිලා දුරවබෝධ වචනවල අර්ථාවබෝධයට ද සිසුන් යොමු කළ යුතු වෙයි.

05 ප්‍රශ්නය

අපේක්ෂණය : ප්‍රායෝගික ලේඛන හැකියාව පිළිබඳ අපේක්ෂකයා සතු කුසලතා මැනීම.

5. දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රදේශවාසීන්ගේ ජීවිතවලට මෙන් ම වගාකටයුතුවලට ද වනඅලින්ගෙන් බාධා පැමිණෙමින් තිබේ. පාසල් දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලටත් සාමාන්‍ය මිනිසුන්ගේ එදිනෙදා කටයුතුවලටත් මෙමගින් ඵල්ල වන්නේ විශාල තර්ජනයකි. මෙම ව්‍යසනයට මුහුණ පා සිටින කහටගස්දිගිලිය ප්‍රදේශයේ බෝවිටිය ග්‍රාමයේ ප්‍රජාසංවර්ධන සමිතියේ ලේකම් ධුරය නොබිඳින දිල්හාර රත්නායක මහතා යයි සිතා, ගම්වාසීන් එකතු වී මෙම උවදුර මැඩපැවැත්වීම සඳහා සම්මත කර ගත් යෝජනා කහටගස්දිගිලිය අඩවි වන නිලධාරි වෙත දන්වමින් ඒවා කඩිනමින් ක්‍රියාවට නැංවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කෙරෙන ඉල්ලීමක් ද සහිත ලිපියක් සකස් කරන්න.

(මේ සඳහා වචන **100**ක් පමණ ප්‍රමාණවත් ය.)

සැසඳෙන්

ප්‍රදේශයේ බහුල ව වැවී, ප්‍රයෝජනයට නොගෙන අපතේ යන පලතුරු වර්ග බෝතල්වලට අසුරා දෙස් - විදෙස් වෙළෙඳපොළවලට අලෙවි කිරීමෙන් ආදායම් උපයා ගත හැකි ස්වයං රැකියා ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට ඔබගේ යෙදෙන සමිතිය විසින් තීරණය කර ඇත. ප්‍රදේශයේ පිළිගත් බැංකුවක් මූලාශ්‍රයප්‍රතිපාදන ලබා දීමටත්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අවශ්‍ය විශේෂඥ දානුම ලබා දීමටත් එකඟතාව පළ කොට තිබේ. මෙම තොරතුරු ඇතුළත් කරමින් ප්‍රදේශයේ රැකියා විරහිත තරුණ-තරුණියන්ට මෙම ව්‍යාපාරයට සම්බන්ධ වීම සඳහා උනන්දුවක් ඇති කෙරෙන ආකාරයේ ආකර්ෂණීය අත් පත්‍රිකාවක් සකස් කරන්න.

(මේ සඳහා වචන **100**ක් පමණ ප්‍රමාණවත් ය.)

(ලකුණු 15 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

රාජකාරි ලිපිය

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 15 යි.

1.	ආකෘතිය සඳහා ලකුණු	04
2.	අන්තර්ගතය සඳහා ලකුණු	08
3.	ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු	03

01. ආකෘතිය සඳහා ලකුණු 04 :

යවන්නාගේ නම, තනතුර, ලිපිනය සහ දිනය	-	ලකුණු 01
ලබන්නාගේ ලිපිනය	-	ලකුණු 01
ආමන්ත්‍රණය (මාතෘකාවට පෙර යොදා තිබිය යුතුය)	-	ලකුණු 01
මාතෘකාව සහ අත්සන	-	ලකුණු 01

(යවන්නාගේ තනතුර, යවන්නාගේ ලිපිනය තුළ හෝ ලිපිය අවසානයේ හෝ සඳහන් වී තිබිය යුතුයි. රාජකාරි ලිපි සඳහා නිර්දේශිත ආකෘති 2 ම නිවැරදි සේ පිළිගැනේ.)

02. අන්තර්ගතය සඳහා ලකුණු 08 :

- මිනිස් ජීවිතවලට සහ වගා කටයුතුවලට අලින්ගෙන් බාධා ඇතිවන බව
  ලකුණු 02 (එක් කරුණකට ලකුණු 01 බැගින්)

- දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලට හා මිනිසුන්ගේ එදිනෙදා කටයුතුවලට එමගින් තර්ජන එල්ලවන බව
  ලකුණු 02 (එක් කරුණකට ලකුණු 01 බැගින්)

- අලි උවදුරු මැඩ පැවැත්වීම සඳහා යෝජනා
  ලකුණු 02 (එක් කරුණකට ලකුණු 01 බැගින්)

- යෝජනා කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගන්නා ලෙස කෙරෙන ඉල්ලීම
  ලකුණු 02

03. ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 03 :

නිවැරදි අක්ෂර වින්‍යාසය, වියරණ, විරාම ලක්ෂණ, පැහැදිලි අත් අකුරු, උක්ත ආඛ්‍යාත සම්බන්ධය, ඡේද වෙන් කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනැමේ. නියමිත වචන ගණන අඩුවන කල්හි හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි හෝ අනුපාතික ලකුණක් පිරිනැමේ.

අත් පත්‍රිකාව

ලකුණු 15 යි. 1, 2, 3 යන අංශ සඳහා වෙන් වෙන්ව ලකුණු දී එම ලකුණුවල එකතුව ලබාගැනේ.

1. ආකෘතිය - ලකුණ 04
2. අන්තර්ගතය - ලකුණු 08
3. ශිල්පීය දක්ෂතා - ලකුණු 03

1. ආකෘතිය
   - මාතෘකාව ලකුණු 01
   - නිර්මාණශීලී බව ලකුණු 01
   - පළකරන්නාගේ නම/ආයතනය ලකුණු 01
   - පළකරනු ලබන දිනය ලකුණු 01

2. අන්තර්ගතය
   1. ප්‍රදේශයේ ප්‍රයෝජනයට නොගෙන අපතේ යන පලතුරු ඇති බව ලකුණු 01
   2. ඒවා බෝතල්වලට අසුරා දෙස් විදෙස් වෙළෙඳපොළට අලෙවි කළ හැකි බව ලකුණු 01
   3. එමගින් ආදායම් උපයාගත හැකි බව ලකුණු 01
   4. ස්වයං රැකියා ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට යොවන සමිතිය තීරණය කර ඇති බව ලකුණු 01
   5. මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමට පිළිගත් බැංකුවක් එකඟ වී ඇති බව ලකුණු 01
   6. විශේෂඥ දැනුම ලබාදීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව එකඟ වී ඇති බව ලකුණු 01
   7. ප්‍රදේශයේ රැකියා විරහිත තරුණ තරුණියන් සිටින බව ලකුණු 01
   8. ස්වයං රැකියා ව්‍යාපෘතියට ඔවුන් තුළ උනන්දුවක් ඇති කරවනසුලු බව ලකුණු 01

3. ශිල්පීය දක්ෂතා (ලකුණු 03 යි)

   නිවැරදි අක්ෂර වින්‍යාසය, පැහැදිලි අත් අකුරු, නිවැරදි පද බෙදීම, වියරණ, විරාම ලක්ෂණ, ඡේද වෙන් කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනැමේ.

   - නියමිත වචන ගණන අඩුවන කල්හි හෝ අදාළ කරුණු ප්‍රමාණවත් ව අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි හෝ අනුපාතික ලකුණක් පිරිනැමේ. (ලකුණු 15 යි)

5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන



5 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 92%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමිවේ.
ඉන් ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 26%ක් ද,
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 28%ක් ද,
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 23%ක් ද,
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 23%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 08ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 46%ක් වන අතර, 26%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 03ක් හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නය යටතේ ඇති විකල්ප කොටස් දෙක අතුරෙන් (අ) කොටසෙහි පහසුතාව 60%ක් ද, (ආ) කොටසෙහි පහසුතාව 53%ක් ද වේ.

ප්‍රායෝගික ලේඛන යටතේ සැකසුණු මේ ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සතුටුදායක ය. පහසුතා මට්ටම් ඉහළ මෙබඳු ප්‍රශ්නවලට සාර්ථක ලෙස පිළිතුරු සපයා වැඩි ලකුණු උපයා ගැනීම සඳහා සිසුන් ප්‍රායෝගික අභ්‍යාසවල නිතර නිරත කළ යුතු ය. රාජකාරි ලිපි මෙන් ම අත් පත්‍රිකා ද ලිවීමේ නිවැරදි රටා හුරු කළ යුතු ය. ආකෘතිය, අන්තර්ගතය හා ශිල්පීය ලක්ෂණ යටතේ වැඩි ලකුණු ලබාගත හැකි ආකාරය ගැන සිසුන් දැනුවත් කළ යුතු ය.

දී ඇති (අ) රාජකාරි ලිපියක් ලිවීම සහ (ආ) අත්පත්‍රිකාවක් ලිවීම යන කොටස් දෙකට සතුටුදායක ලෙස පිළිතුරු සැපයීම සඳහා නිරවුල් අවබෝධයක් ලබා ගැනීම පිණිස ආදර්ශ රාජකාරි ලිපියක් සහ ආදර්ශ අත් පත්‍රිකාවක් පහත දැක්වේ.

රාජකාරි ලිපිය

දිල්හාර රත්නායක,
ලේකම්,
ප්‍රජා සංවර්ධන සමිතිය,
බෝවිටිය,
කහටගස්දිගිලිය
2012.12.20

අඩවි වන නිලධාරි,
කහටගස්දිගිලිය.

මහත්මයාණෙනි,

වනඅලින්ගෙන් වන තර්ජන වැළැක්වීමට පියවර ගන්නා ලෙස ඉල්ලීම

කහටගස්දිගිලිය ප්‍රදේශයේ බෝවිටිය ග්‍රාමය දීර්ඝ කාලයක් තිස්සේ වනඅලි උවදුරට ලක් වෙමින් පවතී. මේ නිසා මිනිස් ජීවිතවලට හා වගා කටයුතුවලට එල්ල වී ඇත්තේ විශාල තර්ජනයකි. වනඅලි තර්ජන හේතුවෙන් බොහෝ දරුවන් පාසල් ගමන නවත්වා ඇත. මිනිසුන්ගේ එදිනෙදා ජීවන කටයුතු ද ඇණ හිට තිබේ.

පසුගිය දා රැස්වූ බෝවිටිය ප්‍රජා සංවර්ධන සමිති රැස්වීමේදී මෙම උවදුර මැඩ පැවැත්වීම සඳහා යෝජනා කිහිපයක් සම්මත කර ගන්නා ලදී. ප්‍රදේශයට හානි ගෙන දෙන වනඅලින් අල්ලා අභය භූමිවලට ගෙන යාමටත් වන සීමාවේ විදුලි වැටක් යෙදීමටත් ඉල්ලා සිටීම එම යෝජනා අතර වෙයි. ප්‍රදේශවාසීන්ගේ ජීවිත හා දේපළ ආරක්ෂා කර ගැනීම සඳහා ඉහත සඳහන් යෝජනා කඩිනමින් ක්‍රියාවට නැංවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කාරුණික ව ඉල්ලා සිටිමි.

මෙයට,
විශ්වාසි,
.....
දිල්හාර රත්නායක,
ලේකම්,
ප්‍රජා සංවර්ධන සමිතිය,
බෝවිටිය.

අත්පත්‍රිකාව

රැකියාවක් සොයන ඔබට මෙන්න මහඟු අවස්ථාවක් !

අප ප්‍රදේශයේ බහුල ව වැවී ප්‍රයෝජනයට නොගෙන අපතේ යන වැළ, වරකා, අඹ, ගස්ලබු ආදි පලතුරු වර්ග ගණනාවක් ඇත. ඒවා නව යන්ත්‍ර සූත්‍ර හා තාක්ෂණය භාවිතයෙන් බෝතල්වල අසුරා දෙස් විදෙස් වෙළඳපොළෙහි අලෙවි කිරීමෙන් ආදායම් උපයාගත හැකි ස්වයං රැකියා ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට අප යෞවන සමිතිය තීරණය කොට ඇත. මේ සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුවත් විශේෂඥ දැනුම ලබා දීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවත් එකඟතාව පළ කොට තිබේ.

අධ්‍යාපන කටයුතු නිම කොට රැකියාවක් අපේක්ෂාවෙන් සිටින ප්‍රදේශයේ උගත් හා නිර්මාණශීලී තරුණ තරුණියන් වන ඔබ ද අප ව්‍යාපාරික ආයතනය සමඟ එක් වී ජයග්‍රහණයේ මඟ විවර කර ගන්නා ලෙස මෙයින් ආරාධනා කර සිටිමු.

2012.12.20

ලේකම්,
එකමුතු යෞවන සමිතිය
සහනගම

2.3 III ප්‍රශ්න පත්‍රය

2.3.1 III ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 02 යි. **මුළු ලකුණු** 80 කි.

නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳ ව අවබෝධය හා රසවින්දන හැකියාව ඇගයීමට ලක් කෙරේ. 1, 2, 3, 4 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අනිවාර්ය වන අතර 5, 6, 7 ප්‍රශ්න අතුරෙන් තෝරාගත් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයීම අපේක්ෂා කෙරේ.

අංක 3 හා 4 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී තෝරාගැනීම සඳහා විකල්ප කොටස් දෙක බැගින් අඩංගු වේ.

2.3.2 III ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන

III පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, ප්‍රස්තාර 5, 6 හා 7 ඇසුරෙන් සකස් කර ඇත. එක් එක් ප්‍රශ්නයට අදාළ ප්‍රස්තාර, ඒ ඒ ප්‍රශ්නයේ නිරීක්ෂණ හා නිගමන සමඟ දක්වා ඇත.



(RD/16/04/OL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරින් සකස් කරන ලදී.)

සිංහල භාෂාව හා සාහිත්‍යය III පත්‍රයෙහි **පිළිතුරු සැපයීම අනිවාර්ය වූ මුල් ප්‍රශ්න හතර අතුරෙන්** 67%ක වැඩිම පහසුතාව ඇත්තේ 4 වන ප්‍රශ්නයට වන අතර 58%ක අඩුම පහසුතාව ඇත්තේ 2 වන ප්‍රශ්නයටය. තෝරා ගැනීමට අවස්ථාව තිබූ ප්‍රශ්න තුන අතුරෙන් වැඩි වශයෙන්ම තෝරා ගනු ලැබ තිබුණේ 6 වන ප්‍රශ්නය වුවත් (ප්‍රස්තාරය 5, පිටුව 11) වැඩිම පහසුතාව ඇත්තේ 7 වන ප්‍රශ්නයටය. 7 වන ප්‍රශ්නයෙහි පහසුතාව 74%ක් පමණ වේ. අඩුවෙන්ම තෝරාගනු ලැබූ 5 වන ප්‍රශ්නයෙහි පහසුතාව 30%ක අවම අගයකට සීමාවී ඇත.

01. ප්‍රශ්නය

අපේක්ෂණය : නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම

ව්‍යූහය හා ලකුණු විග්‍රහය : මුළු ලකුණු 20යි.
මෙම ප්‍රශ්නයට කෙටි පිළිතුරු අපේක්ෂිත අනුකොටස් දෙක බැගින් යුත් කෙටි ප්‍රශ්න දහයක් ඇතුළත් වේ. එක් අනුකොටසකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 20 කි.

1. **(i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. සිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ** නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) "ඒ සියන්නෙ එදට අපේ ගෙදර සේරම ඔඩගින්නෙ සියන එකයි."

(අ) ඉහත සඳහන් ප්‍රකාශය කරන ලද්දේ කවරකු විසින් ද?

(ආ) ඉහත සඳහන් ප්‍රකාශය ඇතුළත් කෙටිකතාව නම් කරන්න.

(ii) "එසේ හෙයින් නුඹට ද සිසියම් **පිඬාවස්** කොට මුත් ගොඩ නගා ලිය නොහැක්ක."

(අ) ඉහත සඳහන් ප්‍රකාශය කරන ලද්දේ කා හට ද?

(ආ) මෙහි කියැවෙන '**පිඬාව**' කුමක් ද?

(iii) ඉත පුරුදු පෙර **කල**
දන් නොප මෙසේ කී **කල**

(අ) ඉහත කවියේ ඉතිරි පද **දෙක** සම්පූර්ණ කරන්න.

(ආ) ඉහත කවියේ තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම දක්වන්න.

(iv) "සදුදට එළි වෙන තෙක් මට ඉවසුම් නෑ."

(අ) සදුදට එළි වෙන තෙක් ඉවසුම් **නොමැත්තේ** කවුරුන් හට ද?

(ආ) සදුදට එළි වෙන තෙක් ඉවසුම් **නොමැත්තේ** කුමක් සිරීමට ද?

(v) "මල්සර හට නී සපයන්නී
යොවුනන් සිත් ඉන් බැඳලන්නී."

(අ) 'සර' යන්නට සමාන පදයක් මේ කවියෙන් උපුටා දක්වන්න.

(ආ) 'මල්සර' යනුවෙන් හැඳින්වෙන්නේ කවරෙක් ද?

(vi) "පසුව රජ්ජුරුවෝත් මුන් පින් අසා ගෙන්වාලා මසු දහසක් දී පින් හැරගෙන ලත් පිනට සතුටු ව මහත් සම්පත් දී සිටු තනතුරු දුන්හ"

(අ) මෙසේ සිටු තනතුරු ලැබුයේ කවරෙක් ද?

(ආ) මේ පුද්ගලයා සිටු තනතුර ලැබීම සඳහා කළ පින්කම කුමක් ද?

(vii) (අ) මහල් ප්‍රස්තාව නාට්‍යයේ එන තත්ත්වනී සමඟ විවාහ වීමට බලාපොරොත්තුවෙන් සිටින පුද්ගලයාගේ නම කුමක් ද?

(ආ) ප්‍රහසන යනුවෙන් හැඳින්වෙන්නේ කවර ගණයේ නාට්‍ය ද?

(viii) (අ) කාව්‍යශේඛරයේ දක්වෙන ඔමුණා, තම දියණිය මහලු ඔමුණාට සරණ පාවා දීමට තුඩු දුන් හේතුව කුමක් ද?

(ආ) එම ග්‍රන්ථය රචනා කෙරුණේ සිහළ රාජධානි යුගයක දී ද?

(ix) (අ) යසෝදරාවතට අනුව මහමායා දේවිය සිහිනෙන් දුටු විල කුමක් ද?

(ආ) මේ විල මැද දී මහමායා දේවිය ස්නානය කරවූයේ කවුරුන් විසින් ද?

(x) (අ) උත්තරෝලිය වස්තුවේ දක්වෙන හොසලු දරුවා, සිහා වැඩි තෙරුන් වහන්සේට දන් දුන්නේ කුමක් ද?

(ආ) '**දෙවෙලා මැදැ**' යනු සිහළ වේලාවක් ද?

(ලකුණු 02 × 10 = 20 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

1. (i) (අ) රාසුල් පූ
(අ) පොළෝ කුහරයෙන් පැමිණි මිනිසා/පොළෝ කුහරයෙන් ආ මිනිසා

(ii) (අ) රජගහ නුවර අසූ කෙළක් ධන ඇති සිටාණන්ට/මත්තලුංගභෝජක පණුවන් හිස රැඳි සිටුවරයාට/ බිම්බිසාර රජුගේ හිතවත් සිටුවරයාට
(ආ) රෝගය සුව කිරීමේදී විඳින්නට සිදුවන දුක් ගැහැට
සත් මසක් වම් ඇලයෙන් සිටීම.

(iii) (අ) නොකොට තව කොලහල
සොඳයි පාවා ගනිමි මනකල
(ආ) පෙර කාලයේ/කාලයේ
කී කල්හි/ කී වේලාවේ/ කියූ අවස්ථාවේ/ කී විට

(iv) (අ) සිරියාවතීට
(ආ) චිත්‍ර තරගයට ඉදිරිපත් වීමට

(v) (අ) හී
(ආ) අනංගයා, මල්සරා, මින්දද, මලවි වැනි සමානාර්ථ පද

(vi) (අ) බත් බැලයා/ හත්ත හත්තික සිටාණෝ/ පිටිසර වැසියා
(ආ) පසේ බුදුන්ට බත් තලිය පූජා කිරීම/ පසේ බුදුන්ට දන්දීම/ තමා ලත් පින් රජුට අනුමෝදන් කිරීම

(vii) (අ) ලව්නේරිස්/ චන්ද්‍රසේකර රාලහාමිගේ ලව්නේරිස්
(ආ) සුබාන්ත ගණයේ නාට්‍ය/ සුබාන්ත/ සතුටින් කෙළවර වන නාට්‍ය/ කොමඩි/ හාස්‍ය උත්පාදන නාට්‍ය

(viii) (අ) ණය ගෙවාගත නොහැකි වීම/ ණය බර/ පරිස්සමට තිබූ මුදල් වියදම් වීම
(ආ) කෝට්ටේ යුගයේදී

(ix) (අ) අනෝතත්ත විල/ අනවතප්ත විල/ අනවතත්ත විල
(ආ) කන්‍යාලියෝ දෙදෙනෙක්

(x) (අ) (පිළිණි) කටු අලයක්
(ආ) මධ්‍යාහ්නයේ/ මහදවල්/ දවල්/ මද්දහනෙ/ ඉර මුදුන්වන වෙලාව/ දවල් දොළහට

1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන



1 ප්‍රශ්නය තෝරාගෙන ඇති පිරිස 98%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.
ඉන් ලකුණු 00 - 05 ප්‍රාන්තරයේ 16%ක් ද,
ලකුණු 06 - 10 ප්‍රාන්තරයේ 29%ක් ද,
ලකුණු 11 - 15 ප්‍රාන්තරයේ 37%ක් ද,
ලකුණු 16 - 20 ප්‍රාන්තරයේ 18%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 16ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් පිරිස 18%ක් වන අතර, 16%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 5ක් හෝ ඊට අඩුවෙනි.



මෙම ප්‍රශ්නයට අයත් අනුකොටස් 20 අතුරෙන් (iv) (අ) සහ (vii) (අ) කොටස්වල 92% බැගින් වන වැඩිම පහසුතාව වාර්තා වී තිබේ. පහසුතාව අඩුම කොටස වන්නේ (ii) (අ) වන අතර එහි පහසුතාව 22% කි.

නිර්දිෂ්ට නූතන, පුරාතන, ගද්‍ය, පද්‍ය, නාට්‍ය ආදි සෑම අංශයක් ම ආවරණය වන පරිදි මෙම ප්‍රශ්නයෙහි අනුකොටස් ඉදිරිපත් කර තිබුණි. පුරාතන සාහිත්‍යය පිළිබඳ අවධානයත් මතකයත් මැන බැලීම සඳහා ඉදිරිපත් කර තිබූ (ii) (අ) සහ (ආ) අනුකොටස්වලට පිළිතුරු සපයා තිබුණේ පිළිවෙළින් 22%ක් සහ 26%ක් වන අඩු ප්‍රතිශතයකි. මෙයින් පැහැදිලි වන්නේ පුරාතන සාහිත්‍ය නිර්මාණවල පුද්ගල නාම සහ ස්ථාන නාම පිළිබඳ මතකය අඩු බවයි. මෙය වර්ධනය කිරීම සඳහා ගුරුභවතුන් විසින් කෙටි ලිඛිත ප්‍රශ්න ඇතුළත් අභ්‍යාස නිතර කරවමින් සිසුන් හුරු කළ යුතු ය. (v) (අ) අනුකොටසට ප්‍රතිචාර දක්වා ඇත්තේ 30%ක අඩු ප්‍රතිශතයකි. පද්‍ය පාඨයක් අවබෝධ කරවීමේදී එහි ඇතුළත් දුරවබෝධ වචනවලට පමණක් සීමා නොවී ඊට සමාන අර්ථ පද, බහු අර්ථ පද ආදිය ද වටහා දීම මීට පිළියම් වශයෙන් ඉදිරිපත් කළ හැකිය. සිසුන්ගේ වාක් කෝෂය පුළුල් කළ යුතු ය. කළුලෑල්ල පාවිච්චි කළ යුතු ය. ලියා දැක්වීම මගින් වැඩිදුරටත් අදහස් තහවුරු කළ හැකි බැවිනි.

02 ප්‍රශ්නය

අපේක්ෂණය : 1. නිර්දිෂ්ට පාඨ පිළිබඳ අවබෝධය ඇගයීම
2. පාඨයක අදහස තම බසින් ලියා දැක්වීමේ කුසලතාව ඇගයීම

ලකුණු විග්‍රහය : ප්‍රශ්නයට හිමි මුළු ලකුණු 20 යි.
එක් කොටසකට ලකුණු 05 බැගිනි. තද කළු අකුරින් ඇති එක් එක් වචනයට නිවැරදි ව තේරුම් ලියා ඇත්නම්,
එක වචනයකට ලකුණු 01 බැගින් - ලකුණු 02 යි
සමස්ත අර්ථයට - ලකුණු 03 යි

2. පහත දක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටස්වල අර්ථය වෙන් වෙන් ව ලියන්න. ඉන් පසු මුළු කොටසේ ම අර්ථය ලිහිල් බසින් ලියන්න.

(i) ඇදගත් තදින් විදි සැර නොවැරැදී වැද
හියපත් මුවෙන් වැමීමෙන ලේ හැලි නොමඳ
බලවත් දුකින් වලපින හිමි තුඹ වැළැඳ
මගේ **නෙත් දියෙන්** සේදී ගෙනැ ගියේ වේද

(ii) "**ඒ දුර්වච** වූ කාරණයෙන් ම නුවණැත්තන්ගේ බස් නොගෙන, සියුම් ශ්‍රවනත් ඇති **බඩිගයෙන්** දෙකඩ කොට නසන ලදු ව මහ වැටී ඔත්තෙහි වේ ද?"

(iii) "පදමට **වෙරළු මිණි කැට** සුනු විසුළ හැඩ
ජෝතිය ළැගුම් ගත් ළා තණ පිටිය උඩ
නැහැ පුඩු මිහත් කොට මී ගොන් මුළුව නැඩ
කිමිදෙති නැවුම් සුස්ගෙහි වෙල් කුඹුරු බව"

(iv) "එකල **කර්මාන්විත වූ ව්‍යාධියක්** හැර අවශේෂ වූ ව්‍යාධි, **එක ආලේප මාත්‍රාවකින්** අන්තර්ධාන වන තරම් වූ දිව්‍යමය ඖෂධ උගත්වත්තා වූ ශක්‍රයෝ ජීවකයන් සත් අවුරුද්දක් මුළුල්ලෙහි වෛද්‍ය ශාස්ත්‍රය උගත්වා නිම වූහ."

(ලකුණු 05 × 04 = 20 යි)

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

i. හියපත් මුවෙන් - හීය වැදුණු ස්ථානයෙන් (තැනින්)/ හීය වැදුණ තුවාලයෙන්
නෙත් දියෙන් - ඇස් කඳුළින්, නෙත්වලින් ගලන කඳුළෙන්/ කඳුළින්

ඇද ගත්තා වූ දුන්නෙන් තදින් විද්දා වූ හී සරය වැරදීමක් නොමැති ව වැදී, හීය වැදුණු ස්ථානයෙන් අඩුවක් නොමැති ව ගලා යන ලේ සමූහය (රුධිර ධාරා), ස්වාමීනි, ඔබ වැලඳගෙන ඉතා දුකින් වැලපෙන මගේ දෙනෙත් කඳුළු දියෙන් සේදී ගෙන ගියා වේ ද?

ii. දුර්වච වූ - අකීකරු, නොහික්මුණු
බඩිගයෙන් - කඩුවෙන්, අසිපතෙන්, බඩිගයෙන්

ඒ නොහික්මුණු කාරණයෙන් ම නුවණ ඇති අයගේ කියුම් නොපිළිගෙන සියුම් වූ මුවහතක් ඇති කඩුවෙන් දෙපලු කොට විනාශ කරන ලද්දේ මහා මාර්ගයෙහි වැටී ඔත්තෙහි වේ ද? (වැටී ගියේ වේ ද, වැටී සිටියේ වේ ද)

iii. වෙරළු මිණි කැට :- වෛදූර්ය මාණික්‍ය කැබලි, කොළ පැහැති මැණික් කැබලි
ජෝතිය :- කාන්තිය, බැබළීම, තෘප්තිය, ප්‍රභාෂ්වර, දීප්තිය

එක පිළිවෙළකට වෛදූර්ය මාණික්‍ය කැබලි විසිරී ගිය ආකාරය මතු කරන කාන්තිමත් ළා තණකොළ සහිත පිට්ටනිය මත හිඳින තරුණ/ශක්තිමත්/නාඹර මී ගොන් සමූහය නාස් පුඬු මහත් කොට වෙල් යාය අසල නැවුම් සුවඳ විඳිති.

iv. කර්මාන්විත වූ ව්‍යාධියක් - කර්මයට අනුව ඇතිවන ලෙඩක්, කර්මානුරූප රෝගයක් (අසනීපයක්)
එක ආලේප මාත්‍රාවකින් - එක් වරක් ගෑ (ආලේප කළ) සුළු බෙහෙත් ප්‍රමාණයකින් (පමණකින්)

එකල්හි කර්මය අනුව ඇතිවන ලෙඩක් හැර වෙනත්/අනෙකුත් ලෙඩ රෝග එක්වරක් (සුළු ප්‍රමාණයක්) බෙහෙත් ගැල්වූ පමණකින් මැකී යන තරම් වූ දිව්‍යමය බෙහෙත් උගන්වන ශක්‍රයෝ හත් අවුරුද්දක් ඇතුළත ජීවකයන්ට වෙදකම උගන්වා අවසන් කළහ.

2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන



අනිවාර්ය ප්‍රශ්නයක් වන මෙය තෝරාගෙන ඇත්තේ 95%ක පමණ ප්‍රතිශතයකි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20ක් හිමිවේ.

ඉන් ලකුණු 00-05 ප්‍රාන්තරයෙහි 26%ක් ද
ලකුණු 06-10 ප්‍රාන්තරයෙහි 20%ක් ද
ලකුණු 11-15 ප්‍රාන්තරයෙහි 25%ක් ද
ලකුණු 16-20 ප්‍රාන්තරයෙහි 29%ක් ද
ලකුණු ලබා ගෙන ඇත.



මෙම ප්‍රශ්නය කොටස් හතරකින් යුක්ත වන අතර, එම කොටස් හතරෙහි පහසුතා පිළිවෙළින් 65%, 55%, 54% හා 56% වේ.

මෙහි පළමුවන කොටසෙහි පහසුතාව 65%ක් වීමට හේතු වී ඇත්තේ පැරණි පද්‍ය සාහිත්‍යය වුවත් එහි කාව්‍යමය භාෂාව සරල වීම ලෙස සැලකිය හැකියි.

සමස්තයක් වශයෙන් මෙම ප්‍රශ්නයට දක්වා ඇති ප්‍රතිචාරවල සාර්ථකත්වය 65% නොඉක්මවා ඇති බව පැහැදිලි ය. සිසුනට ගද්‍ය හෝ පද්‍ය හෝ පාඨවල වාච්‍යාර්ථ ලියා හුරු කරවා නැති බව මෙයින් පෙනී යයි. අර්ථ පැහැදිලි කිරීමට පමණක් සීමා නොවී ගද්‍ය පාඨවල හා පද්‍ය පාඨවල අර්ථ ලියවීමේ අභ්‍යාසවල සිසුන් නිරත කරවිය යුතු ය. 54%ක අඩු පහසුතා මට්ටමක් ලබාගෙන ඇත්තේ නූතන පද්‍ය පාඨයටයි. මීට හේතුව ලෙස පෙනී යන්නේ දුරවබෝධ වචන කීපය නොදන්නා බවයි. සෑම පද්‍ය පාඨයකම අර්ථය පැහැදිලි කිරීමේදී එවැනි වචන ලියා දක්වා සිසුනට ඒවායේ අර්ථ හොඳින් පැහැදිලි කර දිය යුතු ය.

සටහන : අංක 3 සිට 7 තෙක් ප්‍රශ්න සඳහා පහත සඳහන් තොරතුරු අදාළ වේ.

අපේක්ෂණ : ඇගයීම, ප්‍රකාශනය, භාවිත හැකියාව, විචාර හැකියාව හා රසවින්දන හැකියාව ඇගයීමට ලක් කිරීම

ලකුණු විග්‍රහය : 3, 4 ප්‍රශ්න අනිවාර්ය වේ. එකකට ලකුණු 15 බැගිනි.

3, 4 ප්‍රශ්නවල තෝරා ගත් ප්‍රශ්නයේ (i) හා (ii) කොටස් වෙන් වෙන් ව විස්තර සහිත ව ලියා තිබිය යුතුය. උදාහරණ දක්වමින් එක් පිළිතුරක් සේ ලියා තිබුණ ද ලකුණු පිරිනැමේ.

උදාහරණ 04ට	-	ලකුණු 04 යි
සමස්ත විස්තරයට	-	ලකුණු 11 යි
එකතුව	-	ලකුණු 15 යි

5, 6, 7 ප්‍රශ්නවලින් එකක් පමණක් තෝරා ගත යුතු ය. ඒ සඳහා ලකුණු 10 ක් හිමි වේ.

03 ප්‍රශ්නය

- **3, 4** යන ප්‍රශ්න සඳහා වන උත්තරයක වචන **125**ක් පමණ තිබීම සැහේ.

3. යසෝදරාවක පාඨකයාගේ සම්භාවනාවට පාත්‍ර වන්නේ.

(i) ගැමි වහරෙහි එන යෙදුම් හා

(ii) පුනරුක්ති බහුල, සරල බස් වහරක් යොදා ගැනීම නිසා ය. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15 යි)

අපේක්ෂිත පිළිතුර

(i) අදාළ පිළිතුරෙහි ගැමි වහරෙහි යෙදුම් දෙකක්වත් අතුළත් කරමින් විස්තරාත්මක පිළිතුරක් ඉදිරිපත් කර තිබිය යුතුය.

උදා : තුන් ජාමෙට පෙනුණා සඳමඬල මට
දණක් පමණ මල් අතුරපු දිව යහනේ
නේරංජනේ ඉස්නානේ නෑවිල්ලේ
දෙනෝදහක් අඟනෝ මට මල් නෙළුවා
මහ රජුනේ මොකදැයි ඔය දුටු සිහිනේ

(ii) පුනරුක්ති බහුල බස් වහරක් සඳහා නිදසුන් දෙකක්වත් සපයමින් රසවින්දනාත්මක භාෂා ශෛලියකින් ලියා තිබිය යුතුය.

උදා : මොන මොන දෙයක් දෝ නොදැනෙයි සුවාමිනේ

සුදසුන් නිරිඳුනේ මොකදැයි ඔය සීනේ
මහ රජුනේ මොකදැයි ඔය දුටු සීනේ

නේරංජනේ ගංගාවේ සුදු වැල්ලේ
නේරංජනේ ඉස්නානේ නෑවිල්ලේ

රන් යහනේ සැතපෙන කල බිසවුන්ට
රන් මාලාවක් තිබුණා යහන පිට

(ගැළපෙන වෙනත් උදාහරණ ද නිවැරදි සේ පිළිගැනේ. එක් කොටසකට උදාහරණ 2ක් බැගින්

දක්වා තිබීම ප්‍රමාණවත් ය.)

සැකසොත්

'මැනවින් ශාස්ත්‍ර ඉගෙනීම පමණක් නොව, දුර දක්නා නුවණ, ඉවසිලිවන්තභාවය වැනි ගුණාංග වර්ධනය කර ගැනීම සාර්ථක ජීවිතයක් සඳහා වැදගත් වේ.' වේදබ්භ ජාතකයේ එන

(i) බමුණාගේ චරිතය හා

(ii) බෝධිසත්වයන්ගේ චරිතය ඇසුරෙන් උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු 15 යි)

අපේක්ෂිත පිළිතුර

(i) බමුණා මැනවින් ශාස්ත්‍ර ඉගෙන ගත් නමුත් දුරදක්නා නුවණ හා ඉවසිලිවන්තභාවය වැනි ගුණාංගවලින් තොරවූ බව පහත උදාහරණ ඇසුරින් විග්‍රහ කර තිබිය යුතුය.

- අනාරක්ෂිත අවස්ථාවල ශිල්ප බලය පෙන්වීම
- බමුණා පළමු සොරුන් පිටුපස යාම
- ශිෂ්‍යයාගේ අවවාද ගැන නොසිතීම
- තම ජීවිතය ගැන පමණක් සිතා සත්රුවන් වැසි වැස්සවීම
- අවසානයේ මරණයට පත්වීම

වැනි කරුණු දුර දක්නා නුවණින් තොරවූ බව දැක්වීම සඳහා ඉදිරිපත් කර තිබීම සෑහේ.

- ශිෂ්‍යයා එනතුරු බලා නොසිට සත්රුවන් වැසි වැස්ස වීම
- උපාය ශක්තියක් නොමැතිව කෙසේ හෝ සොරුන්ගෙන් ගැළවීමට සිතීම

යන අවස්ථා ඉවසිලිවන්තභාවයෙන් තොර බවට ඉදිරිපත් කළ හැකි කරුණු වේ.

(ii) බෝධිසත්ත්ව චරිතයේ උගත්කම පමණක් නොව දුරදක්නා නුවණින් හා ඉවසිලිවන්ත බවින් යුක්ත බව පහත සඳහන් උදාහරණවලින් ප්‍රකාශ වී තිබිය යුතුය.

- **දුරදක්නා නුවණින් යුක්ත බව**

  උදා : ගුරුවරයා මුහුණ පෑ අනතුර කල්තියා දැන ගැනීම හා ඔහු බේරා ගැනීමට උපක්‍රම යෙදීම

  සොරුන්ගේ මානසික ස්වභාවය හා ක්‍රියාකාරිත්වය ගැන අවබෝධ කර ගැනීම

- **ඉවසිලිවන්ත භාවයෙන් යුක්ත බව**

  උදා : තම ගුරුවරයා සොරුන්ට හසුවූ විට කලබල නොවී ක්‍රියාකිරීම, ගුරුවරයාගේ මෘත දේහයට සන්සුන් සිතින් උපහාර දැක්වීම

  මහා ධනයක් ලබා මෙලොව හා පරලොව සැප ලැබීමට සමත් වීම

(මෙම උදාහරණ මෙන් ම වෙනත් ගැළපෙන උදාහරණ ද නිවැරදි සේ පිළිගැනේ.
එක් කොටසකට උදාහරණ දෙකක් දක්වා තිබීම ප්‍රමාණවත් ය.)

උදාහරණ සඳහා ලකුණු 04
සමස්ත විස්තරයට ලකුණු 11
(මුළු ලකුණු 15 යි)

3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන



අනිවාර්ය ප්‍රශ්නයක් වන මෙය තෝරාගෙන ඇත්තේ 85%ක පමණ ප්‍රතිශතයකි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමිවේ.

ඉන් ලකුණු 00-03 ප්‍රාන්තරයෙහි 20%ක් ද
ලකුණු 04-07 ප්‍රාන්තරයෙහි 21%ක් ද
ලකුණු 08-11 ප්‍රාන්තරයෙහි 33%ක් ද
ලකුණු 12-15 ප්‍රාන්තරයෙහි 26%ක් ද
ලකුණු ලබා ගෙන ඇත.



මෙම ප්‍රශ්නය විකල්ප ප්‍රශ්න දෙකකින් යුක්ත වන අතර ඉන් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතුය. එම ප්‍රශ්න දෙක අතුරෙන්,
පළමුවන ප්‍රශ්නයෙහි
(i) කොටසෙහි පහසුතාව 83%ක් ද
(ii) කොටසෙහි පහසුතාව 51%ක් ද වන අතර

දෙවන ප්‍රශ්නයෙහි
(i) කොටසෙහි පහසුතාව 68%ක් ද
(ii) කොටසෙහි පහසුතාව 44%ක් ද වේ.

"යසෝදරාවත" කවි පෙළෙන් ගත් ප්‍රශ්නයෙහි පළමුවන කොටසට 83%ක් ලකුණු ගැනීම හොඳ ලක්ෂණයක් වුවත් දෙවන කොටසට ලකුණු අඩු වීමට එක් හේතුවක් ලෙස උදාහරණ ඉදිරිපත් නොකිරීම පෙන්වාදිය හැකිය. කවි කටපාඩම් කිරීමට සිසුන් පෙලඹවිය යුතුවෙයි. විකල්ප ප්‍රශ්නයට ලකුණු අඩු වන්නට හේතුව කථා පුවත අමතක වීම විය හැකි ය. විශේෂයෙන් ම එහි (ii) කොටස සඳහා බෝධි සත්ත්ව චරිතය ඇසුරින් උදාහරණ සැපයීම එතරම් සතුටුදායක මට්ටමකට ළඟාවී නොමැති බව පෙනේ. මෙවැනි ප්‍රශ්නවලට සාර්ථක ව පිළිතුරු සැපයීමේ හැකියාව සිසුන් තුළ වර්ධනය කිරීම සඳහා භූමිකා රංගනය වැනි ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම යොදාගත හැකි ය. එසේම චරිත පිළිබඳව සාකච්ඡා කිරීමට වැඩි කාලයක් මිඩංගු කළ යුතු වේ.

විචාරාත්මක පිළිතුරු කිහිපයක් ලියවා සිසුන් ලබාගන්නා ලකුණු ප්‍රමාණය වර්ධනය කළ යුතු වේ.

04 ප්‍රශ්නය

4. (i) "අනුන්ගේ අදහස් තේරුම් නොගැනීම,

(ii) එකිනෙකාට නිගරු වන ලෙසින් කථා කිරීම, ගැටුම්වලට හේතු වේ." මහුල් ප්‍රස්තාව නාට්‍යය ඇසුරෙන් එක කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් පහදන්න.

(ලකුණු 15 යි)

අපේක්ෂිත පිළිතුර

i නාට්‍යය පුරා ම අදාළ පාත්‍ර වර්ගයා එකිනෙකාගේ අදහස් තේරුම් ගැනීමට උත්සාහයක් නොදැරීම දක්නට ලැබේ.

උදා : නන්දාවතී විවාහ කර ගැනීමට ලව්නේරිස් පැමිණි කාරණය තෙපානිස් ගැඹුරින් වටහා නොගැනීම

නන්දාවතී විවාහ යෝජනාව අතරේදී ගවයන් ගැන කථාබහක් මතුකර ගනිමින් අනවශ්‍ය ගැටුමක් ඇති කිරීම

ලව්නේරිස් හා නන්දාවතී අතර ඇතිවන සංවාදයේ දී අන්‍යොන්‍ය අදහස් තේරුම් නොගැනීම

ii එකිනෙකාට නිගරු වන ලෙසින් කථා කිරීම

උදා : ඉඩම් හබයේ දී තෙපානිස්, ලව්නේරිස් හා නන්දාවතී කෝපකාරී වදන් භාවිත කිරීම
ඔල්මාදකාරයෝ, බේබද්දෝ
මතක නැද්ද උඹේ නැන්දා බාස් එක්ක පැනලා ගියා
තමුසෙගේ ආච්චි කුදී
උඹේ තාත්තා සූදු කප්පිත්තා
දඩබ්බරයා, ගොහොදුවා, නීචයා
කුඩුප්පුවා, වනචරයා
වැනි යෙදුම්

(ඉහත උදාහරණ ද වෙනත් ගැළපෙන උදාහරණ ද නිවැරදි සේ පිළිගැනේ.
එක් කොටසකට උදාහරණ 2ක් දක්වා තිබීම ප්‍රමාණවත්ය.)

උදාහරණ සඳහා ලකුණු 04
සමස්ත විස්තරයට ලකුණු 11
මුළු ලකුණු 15 යි

නැතහොත්

'පියසේන ඇසූ ප්‍රශ්නයක්' කවි පන්තියෙහි සාර්ථකත්වයට හේතු වූයේ,

(i) ළමා හැඟීම් දනවන බස් වහරක් භාවිත කිරීම හා

(ii) දෙපද ආකෘතිය යොදා ගැනීම යි."

එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

අපේක්ෂිත පිළිතුර

(i) "පියසේන ඇසූ ප්‍රශ්නයක්" කවි පන්තියේ සාර්ථකත්වයට ළමා හැඟීම් දනවන බස්වහරක් භාවිත කර ඇති අයුරු

- කුඩා දරුවන් තුළ ඇති දස්කම් මතු කිරීම
  හතේ අටේ චක්කරයෙන් ගණන් හදා සමත් වෙලා

- ළමා ලෝකයේ ඇති එකමුතු බව
  හවසට අත්වැල් බැඳගෙන කවි කියන්නෙ අපි දෙන්නා

- ළමා සිත් තුළ සුරතල් සතුන් කෙරෙහි ඇති ආදරය
  ලේනා ගැන පූසා ගැන කවි කියලා සමත් වෙලා

- තමාට වටහා ගත නොහැකි සමාජ ගැටලු පිළිබඳ ප්‍රශ්න කිරීම
  තුනේ ඉඳපු මම හතරට යන්නේ කවදාද ඉතින්

වැනි උදාහරණ

සරල බස් වහරක් ඔස්සේ කවි පෙළ රචනා වී තිබීම ගැන රස වින්දනාත්මක විස්තරයක් ඇතුළත් විය යුතුයි.

(ii) දෙපද ආකෘතිය යොදා ගැනීම

- ළමා ලෝකයේ අත්දැකීම් සරල ව පැවසීමට හැකි වීම
- කුඩා දරුවන්ට තාලානුරූප ව ගැයීමට පහසු වීම

වැනි කරුණු ඔස්සේ උදාහරණ කවි ඇසුරෙන් රස වින්දනයක් කර තිබීම

(මෙම උදාහරණ හෝ ගැළපෙන වෙනත් උදාහරණ නිවැරදි සේ පිළිගැනේ. එක් කොටසකට උදාහරණ 2ක් දක්වා තිබීම ප්‍රමාණවත් ය.)

උදාහරණ සඳහා ලකුණු 04
සමස්ත විස්තරයට ලකුණු 11
මුළු ලකුණු 15 යි

4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන



අනිවාර්ය ප්‍රශ්නයක් වන මෙය තෝරාගෙන ඇත්තේ 86%ක පමණ ප්‍රතිශතයකි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමිවේ.
ඉන් ලකුණු 00-03 ප්‍රාන්තරයෙහි 14%ක් ද
ලකුණු 04-07 ප්‍රාන්තරයෙහි 21%ක් ද
ලකුණු 08-11 ප්‍රාන්තරයෙහි 36%ක් ද
ලකුණු 12-15 ප්‍රාන්තරයෙහි 29%ක් ද
ලකුණු ලබා ගෙන ඇත.



මෙම ප්‍රශ්නය ද විකල්ප ප්‍රශ්න දෙකකින් යුක්ත වන අතර ඉන් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සැපයිය යුතුය. එම ප්‍රශ්න දෙක අතුරෙන්,
පළමුවන ප්‍රශ්නයෙහි
(i) කොටසෙහි පහසුතාව 74%ක් ද
(ii) කොටසෙහි පහසුතාව 50%ක් ද වන අතර

දෙවන ප්‍රශ්නයෙහි
(i) කොටසෙහි පහසුතාව 90%ක් ද
(ii) කොටසෙහි පහසුතාව 55%ක් ද වේ.

අංක 4 ප්‍රශ්නය යටතේ දී ඇති ප්‍රශ්න දෙකෙහිම (ii) කොටස්වලට සිසුන් අඩු ලකුණු ප්‍රමාණයක් ලබාගෙන ඇත. මෙය ඉතා සරල ප්‍රශ්නයක් වන අතර වැඩි ලකුණක් ලබාගත හැකි ව තිබුණි. එම හැකියාව ලබාදීම සඳහා පන්ති කාමරයේදී එම නාට්‍ය කොටස්වල දෙබස් බණ්ඩ සිසුන් ලවා සංවාදාත්මක ව ඉදිරිපත් කළ යුතු වෙයි. එසේම දෙවන ප්‍රශ්නයේ පළමුවන කොටසට 90%ක් වන වැඩි ලකුණු ලබාගෙන තිබීම හොඳ ප්‍රවණතාවකි. නමුත් දෙවන කොටසට අඩුවීමට හේතුව එම ප්‍රශ්නය පිළිබඳ පන්ති කාමරයේදී සාකච්ඡා වන ප්‍රමාණය අඩුවීමයි. සිසුන්ට ප්‍රථම වතාවට පෙළ පොත්වල හමුවන අලුත් කරුණු ගැන වැඩි අවධානය යොමු විය යුතුය.

05 ප්‍රශ්නය

- **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න. උත්තරයක වචන **100**ක් පමණ තිබීම සැහේ.

5. "ධනයෙන් නිසි ප්‍රයෝජන ලබා ගත හැකි වන්නේ නිවැරදි ආයෝජනය මඟින් පමණකි." යන ප්‍රකාශය හත්තහත්තික සිටාණන්ගේ කතාවෙන් උදාහරණ **තුනක්** දක්වමින් විග්‍රහ කරන්න. *(ලකුණු 10 යි)*

අපේක්ෂිත පිළිතුර

දෙමාපියන් රැස්කළ ධනය යෝග්‍ය පරිදි වියදම් කිරීමට ඉදිරිපත් වීමෙන් නිසි ප්‍රයෝජන ලබාගත හැකි වේ. එය නිවැරදි ආයෝජනයයි. ගන්ධක කුමාරයා මේ ගැන නොසිතා ලක්ෂ ගණන් ධනය වියදම් කොට ආහාර අනුභවයට පමණක් සූදානම් වෙයි. එහෙත් බත් බැලයා තමන්ට ලැබුණු ස්වල්ප ආහාර පවා අනුන්ගේ යහපත උදෙසා පරිත්‍යාග කළේය. එනම් පසේ බුදුන් වහන්සේට පූජා කිරීමයි. මේ නිසා ඔහු විවිධ සැප සම්පත් ලැබීමට සමත් විය. මේ කරුණට අදාළ ව සිදුවීම් තුනක් ඇසුරෙන් කරුණු දැක්වීම ප්‍රමාණවත් ය.

බත් බැලයා තමාට ලැබුණු බත් තලිය සම්පූර්ණයෙන්ම පසේ බුදුන්ට දන්දීම
ගන්ධක සිටුවරයාට පින් අනුමෝදන් කිරීම
රජුට පින් අනුමෝදන් කිරීම ආදිය

උදාහරණ සඳහා ලකුණු 03
සමස්ත විස්තරයට ලකුණු 07
(මුළු ලකුණු 10 යි)

(මෙම උදාහරණ හෝ වෙනත් ගැළපෙන කරුණු ඉදිරිපත් කර ඇත්නම් අදාළ ලකුණු පිරිනැමේ.)

5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන



මෙම ප්‍රශ්නය අනිවාර්ය නොවන බැවින් අපේක්ෂකයාගේ අභිමතය අනුව තෝරා ගැනීමට හෝ නොගැනීමට හැකි ය. මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා තිබුණේ අපේක්ෂකයින්ගෙන් 15%ක පමණ ඉතා අඩු ප්‍රතිශතයකි. අඩුම ප්‍රතිශතයක් විසින් තෝරාගනු ලැබ ඇති ප්‍රශ්නය මෙන් ම අඩුම පහසුතාවකින් යුත් ප්‍රශ්නය ද මෙයයි. මෙම ප්‍රශ්නයෙහි සමස්ත පහසුතාව 30%කට සීමා වී ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 10ක් හිමිවන අතර
ඉන් ලකුණු 00-02 අතර 26%ක් ද
ලකුණු 03-05 අතර 27%ක් ද
ලකුණු 06-07 අතර 24%ක් ද
ලකුණු 08-10 අතර 23%ක් ද
ලකුණු ලබා ගෙන ඇත.

මෙය පැරණි ගද්‍ය සාහිත්‍යය ඇසුරින් දෙන ලද ප්‍රශ්නයකි. ඉතා අඩු ප්‍රතිශතයක් ප්‍රතිචාර දක්වන්නටත් සමස්ත පහසුතාව 30%ක් තරම් අඩු අගයකට සීමාවීමටත් හේතුව හත්තහත්තික සිටාණන්ගේ කථා වස්තුවෙහි එන චරිත පිළිබඳ පැහැදිලි අවබෝධයක් සිසුන්ට නොතිබීමයි. ප්‍රධාන චරිත පිළිබඳ ව කණ්ඩායම් වශයෙන් සාකච්ඡා කිරීමට අවස්ථාව ලබා දී ඒවා ඉදිරිපත් කිරීමට ද අවස්ථාව සැලසීම මේ සඳහා පිළියම් ලෙස දැක්විය හැකි ය. මෙම කථා වස්තුව දුරවබෝධ වචන රැසකින් යුක්ත ය. තේරුම් ගැනීමට අපහසු තැන් බොහෝ ය. කථා වස්තුව මතක සිටින පරිදි කෙටි, ලිඛිත ප්‍රශ්න ලබා දී පිළිතුරු ලබාගත යුතු ය. චරිත ඇසුරින් සාරධර්ම මතු කොට දැක්වීමෙන් සිසු අවධානය වැඩි කරගත හැකිය.

ප්‍රශ්න අංකය - 06

6. "කෙටිකතාවක සාර්ථකත්වයට ප්‍රධාන හේතුවක් වන්නේ මනාව සිද්ධි ගැළපීම් හා අවස්ථා නිරූපණය යි." 'අපටත් දවසක ඉර පායා යේ' කෙටිකතාවෙන් උදාහරණ **තුනක්** දක්වමින් මේ කියමන විමසන්න. *(ලකුණු 10 යි)*

අපේක්ෂිත පිළිතුර

මෙහිදී "අපටත් දවසක ඉර පායාවෝ" කෙටි කථාවේ සිද්ධි ගැළපීම් හා අවස්ථා සම්බන්ධය ඇසුරෙන් කරුණු දැක්විය යුතුය. චිත්‍ර තරගයේදී මාළු වෙළෙන්දිය තෝරා ගැනීම, වහලෙන් වැටීම නිසා තාත්තා මිය යාම, සිරියාවතීගේ මව බයිසිකලයක හැපී ඔත්පල වීම හා සමාජ බලපෑම් හමුවේ සිරියාවතී අසරණ වීම ආදිය මෙහි සිද්ධි ගැළපීම සඳහා සුදුසු නිදසුන් වේ.

සිදුවීම් අතර සම්බන්ධය

ගැමි සමාජයේ ස්වරූපය පිළිබිඹු කිරීම, සමාජයේ ඇති නැති පරතරය නිසා ඇතිවන ගැටුම් දැක්වීම ආදිය අවස්ථා නිරූපණය පැහැදිලි කිරීමේදී වැදගත් වේ.

සමාජ පරතරය නිරූපණය කිරීමේදී පද්මා, වනසිංහ, ධර්මරත්න වැනි ගුරු චරිත වැදගත් වේ. මෙබඳු සිදුවීම් ඇසුරෙන් කරුණු 3ක් වත් දක්වමින් විස්තර ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් ය.

(මෙම උදාහරණ හෝ වෙනත් ගැළපෙන කරුණු 3ක් හෝ ඉදිරිපත් කර ඇත්නම් අදාළ ලකුණු පිරිනැමේ.)

උදාහරණ අවස්ථා සඳහා ලකුණු 03 යි
සමස්ත විස්තරයට ලකුණු 07 යි
(මුළු ලකුණු 10 යි)

6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන



අපේක්ෂකයින්ගෙන් 43%ක් පමණ මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ද ලකුණු 10ක් හිමිවන අතර,
ඉන් ලකුණු 00-02 අතර 16%ක් ද
ලකුණු 03-05 අතර 34%ක් ද
ලකුණු 06-07 අතර 32%ක් ද
ලකුණු 08-10 අතර 18%ක් ද
ලකුණු ලබා ගෙන ඇත.

මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 43%කි. එයින් ද වැඩි පිරිසක් එනම් 34%ක් ලබාගෙන ඇත්තේ ලකුණු 03ත් 05ත් අතර ප්‍රමාණයකි. පිළිතුරු සැපයූ අපේක්ෂකයින්ගෙන් 50%ක් ම ලබාගෙන ඇත්තේ ප්‍රශ්නයට හිමි මුළු ලකුණුවලින් අඩක් හෝ ඊට අඩුවෙනි. මෙසේ වීමට හේතුව ලෙස පෙනී යන්නේ මෙම කථාවෙහි සිදුවීම් අතර සම්බන්ධතාව ගැන සිසුන්ට වැටහීමක් නැතිකමයි. ඒ සඳහා සිදුවීම් පෙළ ගස්වා ගැනීමට සුදුසු අභ්‍යාස කරවිය යුතුය. කෙටි කථාවෙන් මතු කෙරෙන සමාජ යථාර්ථ ඉස්මතු කරමින් විවිධ අවස්ථා පන්ති කාමරයේදී නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කිරීමට සිසුන් පෙලඹවිය යුතුය. 34%ක් ලකුණ 05ට අඩුවෙන් ලබාගෙන තිබීම ද සැලකිය යුතු කරුණකි. කෙටි කථා කියවීමෙහි රුචිකත්වයක් නැතිකම ද මෙයට බලපානවා විය හැකිය. වෙනත් කෙටි කථා හඳුන්වා දී කියවීමේ රුචිය වැඩි කළ යුතුය.

07 ප්‍රශ්නය

7. ' 'කිසාගෝතමියක නොවේ' කවි පෙළ නිර්මාණයේ දී, සමාජයෙහි විවිධාකාර සිදුවීම් සංයමයකින් යුතු ව නිරූපණය කිරීම කෙරෙහි කවියාගේ අවධානය යොමු වී ඇත.' කවි පෙළෙන් උදාහරණ **තුනක්** දක්වමින් මේ පිළිබඳ ව සාකච්ඡා කරන්න. *(ලකුණු 10 යි)*

අපේක්ෂිත පිළිතුර

දයාසේන ගුණසිංහ මහතා විසින් නිර්මාණය කරන ලද "කිසාගෝතමියක නොවේ" නම් කවි පෙළ වර්තමාන සමාජ සංකීර්ණතාව තුළින් මතුවූ බේදවාචකයක් පිළිබඳව කියවෙන්නකි. සමාජ අසාධාරණය-යන් පීඩිත වූ මවුවරුන්ගේ වේදනාත්මක ගැටලු දෙස දෙනෙත් නොහෙලූ හරසුන් සමාජයේ බොල් බව ඉදිරිපත් කෙරෙන්නේ මනා සංයමයකිනි.

මෙහිදී කවියා, අවසාන හුස්ම හෙළමින් සිටින තම පොඩි දරුවා වඩාගෙන වෙසක් පොහෝ දිනයේ බැතිමතුන් ඉදිරියේ දරුවාගේ පණනල ගලවා ගැනීම සඳහා මව වැලපෙන ආකාරය නිරූපණය කරයි. මේ වර්ණනයේදී අසරණ දරුවකු වඩාගෙන පිහිට ඉල්ලා හඬන මවක ද වෙසක් උළෙලේ අසිරිය ද අවසානයේ මවගේ විලාප හඬ ද ඉදිරිපත් කිරීම තුළින් සමාජයේ දිළිඳු බව, කුහකත්වය, දුක්ඛදායකත්වය හා භයානකත්වය කවියා නිරූපණය කරයි.

නිසඳැස් ආකෘතිය යොදා ගනිමින් ඉදිරිපත් කළ මේ කවි පෙළෙහි ඒකාග්‍රතාව මනාව මතු වෙයි. එමගින් කාන්තාවගේ අසරණභාවය තීව්‍ර වෙයි. ඒ අතර වෙසක් පොහෝ දින අසිරියට එක්වන උවැසි-උවැසියන් ඇය දෙස හෙලූ උපේක්ෂා සහගත බැල්ම නිසා ඇය වඩාත් අසරණ වෙයි. මෙහි යොදා ඇති "මියැදි බිළිඳුට නැවත පණ නොව මියෙන පොඩි පුතු රකින මග කිය" යන යෙදුමෙන් කාන්තාව මුහුණ දෙන අසරණ තත්ත්වය මතු කෙරෙයි. අවසානයේ ඇය වඩාත් අසරණ තත්ත්වයට පත් වූ ආකාරය,

මවක් ඉකිබිඳ වැලපෙන හඬ
පාලු වීදිය වසා මතුවිය

යන්නෙන් පැහැදිලි වේ. මෙහිදී දරුවා මියගිය බව ව්‍යංග්‍යයෙන් කවියා හඟවයි. ඒ අතර වෙසක් පොහෝ දිනයෙහි උවැසි-උවැසියන්ගේ බැති ගීත් වෙසක් තොරණින් නැගුණු අසිරියත් දනන්ගේ කෙළිලොල් හඬත් මතුකරමින් කවියා සමාජයේ භයංකරත්වය හා ආත්මාර්ථකාමීත්වය පැහැදිලි කරයි. එමගින් උපහාසයක් ද දනවයි. භාෂාව ඉතා සංයමයෙන් යුතුව හසුරුවා ඇත. මේ අනුව සාර්ථක නිර්මාණයක් ලෙස සැලකිය හැකිය.

උදාහරණ අවස්ථා සඳහා ලකුණු 03 යි
සමස්ත විස්තරයට ලකුණු 07 යි
(එකතුව ලකුණු 10 යි)

7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන



මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 34%ක පමණ පිරිසකි. ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමිවේ.
ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 4%ක් ද,
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 12%ක් ද,
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 33%ක් ද,
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 51%ක් ද,
ලකුණු ලබාගෙන ඇත. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු ලබාගැනීම පිළිබඳ ව කැපී පෙනෙන කරුණක් වනුයේ, පිළිතුරු සැපයූ අයදුම්කරුවන්ගෙන් හරි අඩකටත් වැඩි ප්‍රමාණයක්, ප්‍රශ්නයට හිමි මුළු ලකුණුවලින් 80%ක් හෝ ඊට වැඩියෙන් හෝ ලබා තිබීමයි. තවද අයදුම්කරුවන්ගෙන් 84%ක් ම ප්‍රශ්නයට හිමි මුළු ලකුණුවලින් හරි අඩකට වඩා වැඩියෙන් ලබා තිබේ.

මෙම ප්‍රශ්නය තෝරාගත් අයදුම්කරුවන් සංඛ්‍යාව මුළු අයදුම්කරුවන්ගෙන් 34%ක ප්‍රතිශතයකට සීමාවුවත් ලකුණු 08-10 ප්‍රාන්තරයේ ලකුණු ලබාගත් අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය 51%කි. අනෙකුත් ප්‍රශ්නවලට සාපේක්ෂව මෙය ඉහළ ප්‍රතිශතයකි. එමෙන් ම තෝරාගැනීමක් සහිත අංක 5, 6 හා 7 ප්‍රශ්න අතුරෙන් පමණක් නොව III පත්‍රයට අයත් ප්‍රශ්න සියල්ලම අතුරෙන් ද වැඩි පහසුතාව ඇති ප්‍රශ්නය මෙයයි. මෙහි පහසුතාව 74%ක් තරම් ඉහළ අගයක් ගනියි. මෙම කවිපෙළෙන් මතු කෙරෙන සංකීර්ණ සමාජ ගැටලුව පිළිබඳ ව සිසු අවධානය වැඩියෙන් යොමු කරවීමත් විමර්ශනය සඳහා මෙන්ම රසාස්වාදය සඳහා ද සිසුන් යොමු කරවීමත් අවශ්‍ය වන අතර සිසුන් විසින් ලියනු ලබන විචාර, ඇගයීමට හා සාකච්ඡාවට භාජනය කරමින් මෙවැනි ප්‍රශ්නවලට සාර්ථකව පිළිතුරු සැපයීමේ කුසලතාව සිසුන් තුළ වර්ධනය කළ යුතු වේ.

III කොටස

3. පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

3.1 පිළිතුරු සැපයීමේදී සැලකිලිමත් විය යුතු කරුණු

පොදු උපදෙස්

* ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතුය. එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද, කුමන ප්‍රශ්න අනිවාර්යය ද, කොපමණ කාලයක් ලැබේ ද, කොපමණ ලකුණු ලැබේ ද, යන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු අතර ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කරගෙන ප්‍රශ්න තෝරා ගත යුතුය.

* I වන පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී වඩාත් නිවැරදි **එක්** පිළිතුරක් පමණක් තෝරා ගත යුතුය. තවද එක් කතිර ලකුණක් පමණක් යෙදිය යුතුය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයූවා දැයි සුපරීක්ෂාකාරී විය යුතුය.

* II පත්‍රයේ හා III පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී සෑම ප්‍රධාන ප්‍රශ්නයක්ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතුය.

* නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතුය.

* අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවකම අදාළ ස්ථානයේ ලිවිය යුතුය.

* නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවලදී දීර්ඝ විස්තර ඇතුළත් නොකිරීම මෙන්ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවලදී කෙටි පිළිතුරු සැපයීම ද නොකළ යුතුය. අදාළ අවස්ථාවලදී සුදුසු නිදසුන් ඉදිරිපත් කළ යුතුය.

* පිළිතුරු සමන්විත විය යුතු වචන සංඛ්‍යාව දී ඇති විට, එම වචන සංඛ්‍යාවට හැකි තරම් ආසන්න වචන සංඛ්‍යාවකින් යුතු වන සේ පිළිතුරු සංවිධානය කර ගත යුතුය. එසේ නොවීම ලකුණු අඩුවෙන් ලැබීමට හේතු විය හැකි බැවිනි.

විශේෂ උපදෙස් :

* අත් අකුරු සහ අක්ෂර වින්‍යාසය පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය.

* ශිල්පීය දක්ෂතා (පද බෙදීම, විරාම ලක්ෂණ, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම යන අංශ) පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය.

3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් පිළිබඳ අදහස් හා යෝජනා

- ★ සිංහල අක්ෂර මාලාව පිළිබඳ ව පෙළපොත්වල ඇති පාඩම් දෘශ්‍යාධාර භාවිත කරමින් හා ගුරු මාර්ගෝපදේශ ග්‍රන්ථ පරිශීලනය කරමින් නිවැරදි ව ලිවීමේ හැකියාව ප්‍රගුණ කළ යුතුය.

- ★ උක්තාඛ්‍යාත පද සම්බන්ධය පිළිබඳව 10 වන ශ්‍රේණියේ පෙළපොතෙහි අඳාළ පාඩම් දෙක අභ්‍යාසවල යොදවමින් 10, 11 ශ්‍රේණි දෙකේදී ම ක්‍රියාකාරකම්වල නිරත කළ යුතුය.

- ★ පැරණි ගද්‍ය සාහිත්‍ය පාඩම් සිසුන් ලවා කියවීම හා කියවීමෙන් අවබෝධය ලබා ගැනීමට අවස්ථාව ලැබෙන පරිදි අභ්‍යාස සැලසුම් කළ යුතුය.

- ★ රචනා ලිවීමේදී ව්‍යූහගත රචනාවක් යනු කුමක් දැයි පැහැදිලි කර, අ.පො.ස.(සා.පෙළ) විභාගයේදී එවන් රචනාවකට ලකුණු ලැබෙන පිළිවෙළ හා ලකුණු ලබා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රමවේදය පිළිබඳව 10 වන ශ්‍රේණියේදී ම මඟ පෙන්වීම කළ යුතුය.

- ★ ප්‍රායෝගික ලේඛන ලිවීමේදී ඒ ඒ ලේඛනවල වෙනස හඳුන්වා දී ආකෘතියේ වෙනස්කම් සිසුන්ට පැහැදිලි කර දිය යුතුය.

- ★ සාහිත්‍ය පෙළපොතෙහි ඇතුළත් පාඩම් රසාස්වාදය සඳහා ඉඩප්‍රස්ථා ලැබෙන පරිදි හැකි සෑම විට ම නාට්‍යානුසාරයෙන් ඉගැන්වීමට සුදුසු ඉගෙනුම්-ඉගැන්වීම් අවස්ථා සංවිධානය කරගත යුතුය.

- ★ ව්‍යාකරණ ඉගැන්වීමේදී, කවිය, ගීතය හා ප්‍රායෝගික ජීවිතය ඇසුරින් නිදර්ශන සපයමින් රසවත් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම ගුරුවරුන් විසින් නිර්මාණය කරගත යුතුය.

- ★ කර්තෘකාරක හා කර්මකාරක වාක්‍ය පිළිබඳ සිසුන්ගේ අවබෝධය සතුටුදායක නොවන බැවින් සරු ඉගැන්වීම් ක්‍රම මගින් භාවිත හැකියාව නැංවීමට පියවර ගත යුතුය.

- ★ සමානාර්ථ, විරුද්ධාර්ථ හා බහුඅර්ථ පද ඇතුළු වාක් කෝෂය සංවර්ධනය සඳහා උපකාර වන සරල අභ්‍යාසවල නිතර යෙදීමට අවස්ථා සම්පාදනය කළ යුතුය.

- ★ අක්ෂර වින්‍යාසය බොහෝ විට වැරදි ලෙස භාවිත කෙරෙන වචන තෝරා ගෙන ඒවා නිවැරදිව භාවිත කිරීම සඳහා සතතාභ්‍යාස කළ යුතුය.

- ★ බාහිර පොත් පත් කියවීමට පෙලඹෙන පරිදි විෂය සමගාමී කටයුතු සංවිධානය කළ යුතුය.

- ★ පන්ති කාමර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට අමතර ව සිසුන් නිර්මාණකරණයෙහි යෙදවීමට ද උනන්දු විය යුතුය.

- ★ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමේදී අඩු සාධන මට්ටමක් සහිත සිසුන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය.

- ★ අත් පත්‍රිකා, රාජකාරි ලිපි ඇතුළු ලේඛන කුසලතා ප්‍රවර්ධනය සඳහා ප්‍රායෝගික ලේඛන අත්දැකීම් සිසුනට ලබාදීමට ක්‍රියා කළ යුතුය.

- ★ වාර විභාග ලකුණු පදනම් කර ගනිමින් සිංහල භාෂාව හා සාහිත්‍යය විෂයය සමත් වීමේ ලකුණු සීමාවට ආසන්න වී ඇති සිසුන් සඳහා කෙටි කාලීන ප්‍රතිකාරක වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතුය.

- ★ සංවේදී භාවයෙන් හා රසඥතාවෙන් පිරිපුන් රසිකයකු බිහි කිරීමෙහිලා සාහිත්‍යයෙන් සිදුවනුයේ අපමණ මෙහෙයකි. එවන් පුද්ගලයින් සමාජයට මහඟු සම්පතකි. සමාජය මිනිස්කමින් පුරවන්නට නම් සාහිත්‍යය කෙරෙහි වඩාත් හොඳින් සිසුන් යොමු කරවීම කාලීන අවශ්‍යතාවකි. මේ පිළිබඳ ගුරු භවතුන් ඇතුළු අදාළ බලධාරීන්ගේ අවධානය යොමු විය යුතුය.